# කාර්ය සාධන වාර්තාව - 2022



කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

(වැය ශීර්ෂ අංකය - 171)

# පටුන


| අන්තර්ගතය | පිටු අංක |
|---|---|
| **පරිච්ඡේදය 01** | |
| ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 1 - 27 |
| **පරිච්ඡේදය 02** | |
| ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 28 - 53 |
| **පරිච්ඡේදය 03** | |
| වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 54 - 62 |
| ඇමුණුම I | i – xv |
| **පරිච්ඡේදය 04** | |
| කාර්ය සාධන දර්ශක | 63 - 66 |
| **පරිච්ඡේදය 05** | |
| තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 67 - 80 |
| **පරිච්ඡේදය 06** | |
| මානව සම්පත් පැතිකඩ | 81 - 87 |
| **පරිච්ඡේදය 07** | |
| අනුකූලතා වාර්තාව | 87 - 95 |

# පරිච්ඡේදය 01

## ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 කාන්තා හා ළමා කටයුතු අංශය

### 1.1.1 අංශයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

**ශ්‍රී ලාංකීය අනන්‍යත්වයෙන් හා ඵලදායී පුරවැසියන්ගෙන් යුතු, පවුලේ සතුට හා සමාජ සමානාත්මතාවය තහවුරු වූ තිරසර සංවර්ධිත සෞභාග්‍යමත් දේශයක්**

**මෙහෙවර**

**ජාතික ප්‍රමුඛතා හා අවශ්‍යතා මෙන්ම ජාත්‍යන්තර ප්‍රමිතීන්ද සැලකිල්ලට ගනිමින් ළමුන් හා කාන්තාවන් ආර්ථික, සමාජයීය හා අධ්‍යාපනික වශයෙන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය නෛතික, ආයතනික, මානව සම්පත් සේවා හා යටිතල පහසුකම් සම්පාදනය කිරීම, වැඩි දියුණු කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

## 1.1.2 හැඳින්වීම

2015 - 2030 තිරසර සංවර්ධන ඉලක්ක යටතේ ප්‍රමුඛ ඉලක්කයක් වන්නේ සෑම කාන්තාවකටම සහ දරුවෙකුටම ස්ත්‍රී පුරුෂ සමාජභාවිය විභේදනයෙන් තොරව සමසාධාරණත්වයෙන් යුතුව ජීවත් වීම සඳහා සමාජයීය, ආර්ථික සහ නිතීමය වශයෙන් පවතින බාධාවන් ඉවත් කර ඔවුන් ඒ සඳහා සවිබලගැන්වීමය. මෙම අරමුණ සාක්ෂාත් කිරීම සඳහා මෙන්ම, ඊට සහාය වනු පිණිස ශ්‍රී ලංකාව විසින් බැඳී සිටින විවිධ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මුතීන් හා ප්‍රඥප්තීන් ක්‍රියාත්මක කරන රාජ්‍ය යාන්ත්‍රණයේ ප්‍රධාන පාර්ශවකරුවා ලෙස කාන්තා හා ළමා කටයුතු විෂයභාර අමාත්‍යාංශය විසින් ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, ඇගයීම හා පසුවිපරම් සිදුකිරීම ප්‍රමුඛව සිදුකරනු ලබයි.

එතුළින් ශ්‍රී ලාංකීය දරුවන්ගේ සමස්ත සංවර්ධනය සහතික කිරීම මෙන්ම, සිය බුද්ධිය හා ශක්තිය උපරිම හා යහපත් ලෙස භාවිත කරමින් ස්වශක්තියෙන් අභියෝගයන්ට මුහුණදිය හැකි ශ්‍රී ලාංකේය කාන්තා පරපුරක් වෙනුවෙන් උචිත පරිසරයක් නිර්මාණය කිරීමට හා ඔවුන් සමාජයීය හා ආර්ථික වශයෙන් බලගැන්වීම උදෙසා ක්‍රියාත්මක වන ප්‍රධාන යාන්ත්‍රණය ලෙස කටයුතු කරනු ලබයි.

පැවැති කොවිඩ් වසංගත තත්ත්වය හා පැවැති ආර්ථික අර්බුදය හමුවේ වුවද දිවයින පුරා විසිරී සිටින දරුවන් සඳහා අවශ්‍ය සේවාවන් ගුණාත්මක වශයෙන් ඉහළ නැංවීමටත් එම සේවා ව්‍යාප්ත කර හැරීමටත් මානව සම්පත් සංවර්ධනයට හා යටිතල පහසුකම් සංවර්ධනයටත් කාර්යභාරයන් රැසක් ඉටු කිරීමට 2022 වසරේදී ද කටයුතු කරන ලදී. ඒ යටතේ රටේ දරුවන්ගේ හා මව්වරුන්ගේ පෝෂණය නංවාලීම හා පෙර පාසල් දරුවන්ගේ වෘත්තීය අනන්‍යතාවය අගයනු පිණිස ආර්ථික හැකියාවන් වර්ධනය කිරීමට පියවර රැසක් ගැනීමට හැකිවීම ද කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා ඔවුනට නව ජීවනෝපාය හා ව්‍යවසායකත්ව සංවර්ධනයට උපරිම දායකත්වයක් ලබාදීමට කටයුතු කිරීම ද ඉටු කරන ලද ප්‍රමුඛ කාර්යභාරයන් අතර විය.

තවද දැයේ දරුවන්ගේ පෝෂණය ඉහළ නැංවීම, ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම මෙන්ම ළමා නිවාසගත දරුවන්ගේ සුබ සාධනය වෙනුවෙන් හා අවදානම් සහිත දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ප්‍රතිපත්ති හා නව වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාවට නැංවීම, අපයෝජනයට ලක්වන දරුවන් සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාත්මක වී අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීම මෙන්ම ඉහත කාර්යයන්හි නිරන්තර අධීක්ෂණ ක්‍රියාවලිය උදෙසා කාන්තා හා ළමා කටයුතු අංශය කටයුතු කරනු ලැබීය. විශේෂයෙන් ළමා සංවර්ධන ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා දැයේ දරුවන්ට හිතකාමී හා සංවේදී වූ කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය වන්නා වූ නීතිරීති, ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා නියාමනය සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී.

මේ සඳහා කාන්තා හා ළමා කටයුතු අංශය යටතේ වන මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය, ජාතික කාන්තා කමිටුව හා මුල් ළමාවිය සංවර්ධන ලෝක බැංකු ව්‍යාපෘතිය (ලෝක බැංකු ආධාර) ද ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

## අරමුණු

- කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
- කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සලකනු ලැබීම ඉවත් කිරීම පිළිබඳ සිඩෝ ප්‍රඥප්තිය (CEDAW) අනුව කටයුතු කිරීම.
- එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් 2017 වසරේදී ඉදිරිපත් කර ඇති තිරසර සංවර්ධන අභිමථාර්ථ (Sustainable Development Goals) 17 සහ එහි පළමුවන ඉලක්කය වන දරිද්‍රතාවය සෑම ආකාරයකින්ම සෑම තැනින්ම අවසන් කිරීම.
- තිරසර සංවර්ධන අභිමථාර්ථයන්හි (Sustainable Development Goals) 5 වන ඉලක්කය වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අත්පත් කර ගැනීම හා කාන්තාවන් හා ගැහැණු ළමයින් බල ගැන්වීම.
- ගෘහස්ථ හිංසන වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කිරීම. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනයන් වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම බලාත්මක කිරීම.
- ගෘහමූලික කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම බලාත්මක කිරීම.
- කාන්තාවන් සම්බන්ධ සුවිශේෂ ක්ෂේත්‍ර සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- කාන්තා ප්‍රඥප්තිය තුළින් අපේක්ෂිත වගකීම් සාක්ෂාත් කර ගැනීමෙහිලා ලබා ඇති ප්‍රගතිය පරීක්ෂා කිරීම සහ එහි අරමුණු සාධනය ඇගයීම.
- කාන්තාව, පවුල, සමාජය හා සේවා ස්ථානයන් තුළ වෙනස්කම්වලින් ආරක්ෂා කිරීම හා කාන්තාවන් හා දරුවන්ට නිදහසේ ජීවත්වීමට අවශ්‍ය රැකවරණය ලබාදීම.
- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ලෙස කටයුතු කිරීම.
- රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ජාලගත කිරීම.
- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයට අදාළ වන පර්යේෂණ සිදු කිරීම, දත්ත රැස්කිරීම සහ වැඩසටහන් සම්පාදනය කිරීම.
- මුල් ළමාවියේ දරුවන්ගේ සමස්ත සංවර්ධනය සඳහා අදාළ වන පුහුණු වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- මුල් ළමාවිය සංවර්ධනයට අදාළ මානව සම්පත් සංවර්ධනය.

## 1.1.3 ප්‍රධාන කර්තව්‍යයන් හා කාර්යයන්

- කාන්තාවන් එකම ජාලයක් තුළ සංවිධානය කිරීම, ඔවුන් ආර්ථික වශයෙන් ද සමාජීය වශයෙන් ද බල ගැන්වීම සඳහා සුදුසු වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම.
- සියලුම වයස් පරාසවල කාන්තාවන්ගේ සුවිශේෂිතා හඳුනාගෙන ඔවුන් උචිත පරිදි රටේ සමස්ත සංවර්ධනයේ කොටස්කරුවන් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තාවන් වීම නිසාම ඔවුන් මුහුණ දෙන සමාජයීය දුෂ්කරතා මඟ හැරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සමාජයේ විශේෂ හේතූන් නිසා විවිධ පීඩාවන්ට මුහුණ දෙන කාන්තාවන් අරභයා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සමස්ත කාන්තා පරපුරේ දැනුම, කුසලතා හා ආකල්ප ඉහළ තලයකට නංවාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තාවන්ට එකම සංවිධානයක් තුළ ක්‍රියාත්මක වීම සඳහා (Smooth Functioning) ප්‍රජාමූල මට්ටමේ සිට ජාතික තලය දක්වා කාන්තාවන් එකම ජාලයක් තුළ සංවිධානය කිරීම.
- අවධානමට ලක්වූ සහ දරිද්‍රතාවයෙන් පෙළෙන කාන්තාවන් ආර්ථික හා සමාජයීය වශයෙන් සවිබල ගැන්වීම (CEDAW විශේෂ ව්‍යාපෘතිය) ක්‍රියාත්මක කිරීම.
- ස්ත්‍රී පුරුෂභාවය මත ඇතිවන වෙනස්කම් පිළිබඳ වූ පැමිණිලි පිළිගැනීම, සන්නිරීක්ෂණය හා ඒවා අදාළ පාලක බලධාරීන්, සම්බන්ධිත තැනැත්තන් හෝ මණ්ඩල වෙත අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීම.
- කාන්තා ප්‍රඥප්තියේ ඇතුළත් විධිවිධාන කඩ කිරීම සම්බන්ධයෙන් වන පැමිණිලි, සහන, නෛතික ආධාර හෝ සමස්ත සේවා සඳහා රජයේ හෝ රජයේ නොවන සංවිධාන වෙත යොමු කිරීම.
- එම ක්‍රියාමාර්ග සමීක්ෂණය, අදාළ පාලන බලධාරීන්ගෙන් වාර්ෂික ප්‍රගති වාර්තා ලබා ගැනීම සහ එම වාර්තා රට තුළ ප්‍රචලිත කිරීම ආදියට අවස්ථාව සැලසීම.
- ප්‍රඥප්තියේ අන්තර්ගතව ඇති පරිදි, කාන්තා අයිතිවාසිකම් හා වගකීම් විෂයෙහි නෛතික සහ සංවර්ධන ප්‍රතිපත්තීන්වලින් ඇතිවන බලපෑම ඇගයීම.
- අදාළ පර්යේෂණ දිරි ගැන්වීම තුළින් ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට උපකාරී වීම සහ ඒ පර්යේෂණ පදනම් කරගත් ප්‍රතිසංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

- කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳව, විෂයභාර අමාත්‍යවරයා විසින් ජාතික කාන්තා කමිටුවේ අවධානයට යොමු කෙරෙන කරුණු පිළිබඳව හෝ උචිතයැයි කමිටුව සිතන කටයුතු කිරීමට හෝ අමාත්‍යතුමා වෙත උපදෙස් දීම.

- දිස්ත්‍රික් සහ ළමා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම.
- එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල යටතේ වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම් සඳහා වූ ව්‍යාපෘතිය (Gender and Women's Rights ) ක්‍රියාත්මක කිරීම.
  - ✓ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය තහවුරු කර කාන්තාවන් හා ගැහැණු දරුවන්ට එරෙහිව සිදුවන හිංසනයන් වළක්වාලීමටත් ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදෙමින් සංවර්ධනයේ සමාන ප්‍රතිලාභ ලබාගැනීමට අවස්ථාව සැලසීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර 2022 වසරේ වැඩසටහන් සඳහා රු.මි.6.9ක ප්‍රතිපාදන එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) විසින් අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.
  - ✓ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනයන් අවම කිරීම හා ඊට නිසි විසඳුම් සැපයීමට රාජ්‍ය හා රාජ්‍ය නොවන යාන්ත්‍රණ කාර්යක්ෂමව ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් සාමූහිකව සිය සේවාලාභින් වෙත සේවා සැපයීමේ ක්‍රමවේදය සැකසීම අරමුණු කරගෙන; එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ තාක්ෂණික දායකත්වයෙන් හා අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට පත් වින්දිතයන් සඳහා අවශ්‍ය සේවාවන් වෙත යොමුකිරීමේ යාන්ත්‍රණය පිළිබඳ මාර්ගෝපදේශ ඇතුළත් අත්පොත (Referral Guideline) භාෂාත්‍රයෙන් සකස් කර දිස්ත්‍රික්ක 25 හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 334 වෙත බෙදා හරිමින් එහි ඇතුලත් කරුණු සම්බන්ධයෙන් දැනුවත්වීමට මාර්ගගත වැඩසටහන් පැවැත්වීමට කටයුතු කිරීම.
  - ✓ මාර්ගගත ක්‍රමය උපයෝගී කරගනිමින් ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් සඳහා මාර්ගගත මෙවලම් භාවිතය (online platforms such as Zoom, Google Meet, WebEx & Microsoft Teams) පිළිබඳ පුළුල් දැනුමක් ලබාදීම සඳහා මාර්ගගත විඩියෝ නිබන්ධන මාලාවක් සිංහල හා දමිළ මාධ්‍යයෙන් සකස්කර අධ්‍යයන අත්පොතක් ලෙස Teleconferencing Platforms නමින් දිස්ත්‍රික්ක 25 හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 334 වෙත තැපැල් මාර්ගිකව බෙදාහැරීම.

- ළමුන් සඳහා වූ සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. ඒ යටතේ
  - ✓ නව යෞවන ගැහැණු දරුවන් අඩු වයස් ගැබ් ගැනීම්වලින් වැළැක්වීම උදෙසා උතුරු හා නැගෙනහිර පළාත්වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 79 ක කාන්තා හා ළමා සංවර්ධන ඒකකවල ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- ✓ "අඩු වයස් ගැබ් ගැනීම් වැලැක්වීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ කාන්තා හා ළමා සංවර්ධන ඒකකවල කාර්ය මණ්ඩලවල ධාරිතා වර්ධන පුහුණු මොඩියුලය" පාදක කර ගනිමින් සිදුකළ අතර එම පුහුණු මොඩියුලය එම පළාත් වල සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමු කිරීම.

- ➢ අධි අවදානම් දරුවන් සිතියම්ගතකරණය (MVC mapping)

  අධි අවදානම් සහිත දරුවන් හඳුනා ගැනීම හා එම අවදානම් සහිත සාධක මැඩලීම මඟින් එම දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විධිමත් හා ක්‍රමානුකූල ප්‍රවේශයක් රාජ්‍ය ආයතන විසින් අනුගමනය කිරීම ප්‍රධාන අරමුණ කරගත් මෙම වැඩසටහන සඳහා අමාත්‍යාංශය විසින් මාර්ගෝපදේශයක් ද සකස් කර ඇත.

## 1.1.4 සංවිධාන සටහන



## 1.1.5 කාන්තා හා ළමා කටයුතු අංශය යටතේ පවතින් ආයතන හා අංශ



## 1.1.6. ළමා හා කාන්තා කටයුතු අංශය යටතේ පවතින ආයතන/ අරමුදල්

| | ආයතනය | අරමුදල් |
|---|---|---|
| 1 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපර්තමේන්තුව | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සතුව අරමුදල් පවත්වාගෙන යනු නොලබන අතර සියලු මුල්‍යමය කටයුතු භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදා ගනිමින් සිදු කරනු ලබයි. |
| 2 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | රාජ්‍ය ළමා ආරක්ෂණය සඳහා අරමුදල් රැස් කිරීමේ අරමුණින් පිහිටුවා ඇති ජාතික ළමා ආරක්ෂක අරමුදල (1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ 20 (2) වගන්තියට අනුව ඒකාබද්ධ අරමුදලෙන් ලබාදෙනු ලැබිය හැකි සියලු මුදල්, අධිකාරියට දී ඇති සියලු බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් හා ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් ඇතුළත් අරමුදලකි. |

## 1.1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම | ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|
| තිරසර ප්‍රජා පදනම්වූ පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන | සෙමාවුල් ගෝලීය පදනම | ඇ.ඩො ලක්ෂ 8 | 2022-2026 |
| ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැලැක්වීම ආශ්‍රිත සහායක කාර්යයන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා දිස්ත්‍රික් කාන්තා හා ළමා ඒකක සහ කාන්තා රැඳවුම් මධ්‍යස්ථාන සඳහා CDMA ලබාදීම හා ලැප්ටොප් පරිගණක ලබාදීම | එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල හෙවත් UNFPA | රු.මි 5.339 | 2022.01.01-2022.12.31 |

| | | | |
|---|---|---|---|
| එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල යටතේ වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව, ප්‍රජනන සෞඛ්‍ය සඳහා ඇති හිමිකම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිටුදැකීම සඳහා වූ ව්‍යාපෘතිය | එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල හෙවත් UNFPA | රු.මි. 6.9594 | 2022 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා |
| එකාබද්ධව "කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රය" යන ව්‍යාපෘතිය | එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය (UN WOMEN) | රු.මි. 290.59 (2022 සඳහා) | 2020 -2022 |
| ජාතික මට්ටමින් උපදේශන දත්ත පද්ධතියක් සකස් කිරීමේ නියමු ව්‍යාපෘතිය | ආසියානු පදනම | - | 2022.01.01සිට |
| ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, ප්‍රජනන අයිතීන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය පිළිබඳ ඒක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල ව්‍යාපෘතිය | එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNIPA) | රු.මි.1.5077 | 2022 ජනවාරි 2022 දෙසැ |
| ආහාර සුරක්ෂිතතාවය සහ ජීවනෝපාය යථා තත්ත්වයට පත් කිරීමේ හදිසි ආධාර ව්‍යාපෘතිය - අවධානම් සහගත කාන්තාවන්, නව යොවුන් වියේ දරුවන්, ළමුන් සහ කාන්තා රැකවරණ මධ්‍යස්ථානවල රැකවරණය ලබන වින්දිත කාන්තාවන් වෙනුවෙන් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | - | 2022-2024 |
| කාන්තාවන් හා ළමුන් සඳහා පැය 24 නිදහස් දුරකතන සේවාව | සාර්ක් සංවර්ධන අරමුදල | ඇ.ඩො. 437,950 | 2021 ජූනි 30 සිට 2022 ජූනි 30 දක්වා |
| ළමුන් සඳහා වූ සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය (Social Protection of Children) | Save the Children | රු.මි.12.222 (2022 වසරට) | 2016 - 2022 දෙසැම්බර් |

## 1.2 සමාජ සවිබල ගැන්වීම් අංශය

### 1.2.1 අංශයේ දැක්ම, මෙහෙවර

#### දැක්ම

**වසර 2030 වන විට දිළිඳුකමින් හා කුසගින්නෙන් තොර ශ්‍රී ලංකාවක්.**

#### මෙහෙවර

**වැඩිදියුණු කළ සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග, ජීවනෝපාය ආධාර, ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම්, රැකියා අවස්ථා, රැකියා අභිමුඛ දැනුම සහ වෘත්තීය පුහුණුව සැපයීම මගින් අවධානමට ලක් වූ ප්‍රජාව සවිබලගැන්වීම.**

### 1.2.2 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2289/43 හා 2022.07.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය ස්ථාපිත විය.

2030 වන විට දිළිඳුකම තුරන් කරමින් සෞභාග්‍යමත් දේශයක් ගොඩනැගීමේ දැක්ම පෙරදැරිව ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ඇති කිරීම සඳහා අදාල නීති අණපනත්වලට අනුකූලව සමාජ සවිබල ගැන්වීම් විෂයන්ට අදාළව විෂයන්ට අදාල ප්‍රතිපත්ති සම්පාදනයට සහය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යාංශයේ සමාජ සවිබල ගැන්වීම් අංශයට අයත් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාල ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම අමාත්‍යාංශයේ සමාජ සවිබල ගැන්වීම් අංශයේ කාර්ය භාරය වන අතර දෙපාර්තමේන්තු, ආයතන හා අංශ පහත පරිදි වේ.

i. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD)
ii. සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS)
iii. සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB)
iv. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය (NSPD)
v. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය (NSE)
vi. ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)
vii. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)
viii. ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය (RDTRI)
ix. උපදේශන අංශය

ඒ අනුව සමාජයේ ජීවත්වන අවාසි සහගත තත්ත්වයන්හි සිටින පුද්ගලයින් සඳහා හිතකාමී පරිසරයක් හා අවස්ථා උදාකර දීමෙන් ඔවුන්ද සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත්කිරීම සඳහා පහත ප්‍රධාන ඉලක්කගත කණ්ඩායම් සඳහා සේවා සපයයි.

- අඩු ආදායම්ලාභී පවුල්
- ආබාධ සහිත පුද්ගලයින්
- වැඩිහිටි පුද්ගලයින්

මෙම ප්‍රධාන ඉලක්කගත කණ්ඩායම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් පසුගිය වසර තුල ක්‍රියාත්මක වූ සංවර්ධන වැඩසටහන් හරහා අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ දරිද්‍රතාවය අවම කරමින් සෞභාග්‍යමත් ජාතියක් ගොඩනැංවීමට මෙම අමාත්‍යාංශයේ සමාජ සවිබල ගැන්වීම් අංශය මඟින් මහඟු දායකත්වයක් ලබාදී ඇත.

ඒ අනුව, අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වැය ශීර්ෂ අංක 171 යටතේ ක්‍රියාත්මක වන අතර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ 331 යටතේ ද සමාජ සේවා දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ 216 යටතේ ද පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ 217 යටතේ ක්‍රියාත්මක වන අතර මෙම කාර්ය සාධන වාර්තාව මඟින් වැය ශීර්ෂ අංක 171 ට අදාළ ප්‍රගතිය දැක්වේ.

### 1.2.3 ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන්

(2022.07.22 අංක 2289/43 දරණ ගැසට් පත්‍රය අනුව)

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යය හා කර්තව්‍යයන් පහත පරිදි වේ.

- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් විෂයන්ට සහ අමාත්‍යාංශයට අනුබද්ධ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන  මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
- සුවිශේෂී කුසලතා ඇති දරුවන්ගේ එම කුසලතා ඔප්නංවා ගැනීම සඳහා මූලාධාර සැපයීම
- සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරිම
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතාවන් හඳුනාගැනීම හා එම අවශ්‍යතා ඉටුකර දීම
- මහජන ආධාර යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම
- ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට,  ලාදුරු රෝගීන්ට, පිළිකා හා තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබා දීම
- පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සම්මුතීන් වලට අදාළ කටයුතු
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ජනප්‍රවාහනය හා එක්ව කටයුතු කිරීමට හැකි වන සේ අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීම හා අවශ්‍ය පහසුකම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම
- වයෝවෘද්ධ තැනැත්තන් රැකබලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම

## 1.2.4 සංවිධාන සටහන




අධ්‍ය.ජ.(DSD)- අධ්‍යක්ෂ ජනරාල් (Department of Samurdhi Development)
අධ්‍ය.ජ.(NISD) - අධ්‍යක්ෂ ජනරාල් (National Institute of Social Development)
අති.අධ්‍ය.ජ. (DSD) - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (Department of Samurdhi Development)
අති.අධ්‍ය.ජ. (DSD) - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (National Institute of Social Development)
ජ්‍යෙ.ස.ලේ - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ස.ලේ. - සහකාර ලේකම්
නි.අධ්‍ය - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.අධ්‍ය -සහකාර අධ්‍යක්ෂ
අධ්‍ය.(RDTRI) - අධ්‍යක්ෂ (Rural Development Training and Research Institute)
නි.සා. - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
සං.නි. - සංවර්ධන නිලධාරි

අධ්‍ය (සං) - අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍ය (සැල.) - අධ්‍යක්ෂ (සැලසුම්)
අධ්‍ය (SDB) - අධ්‍යක්ෂ - (Saubhagya Development Bureau)
ප්‍ර.ග. - ප්‍රධාන ගණකාධිකාරී
ප්‍ර.අ.වි. - ප්‍රධාන අභ්‍යන්තර විගණක
අධ්‍ය.(NSPD) -අධ්‍යක්ෂ (National Secretariat for Persons with Disabilities)
අධ්‍ය.(NSE) -අධ්‍යක්ෂ (National Secretariat for Elders)\
අධ්‍ය.(Coun) - අධ්‍යක්ෂ - (Counselling)
ස.සා. - සහකාර සාමාන්‍යාධිකාරී (Sri Lanka Social Security Board)
කල.සහ. - කළමනාකරණ සහකාර
කා.කා.ස. - කාර්යාල කාර්ය සහායක

### 1.2.5 සමාජ සවිබල ගැන්වීම් අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ ආයතන හා අංශ



### 1.2.6 අමාත්‍යාංශයේ සමාජ සවිබල ගැන්වීම් අංශය යටතේ පවතින ආයතන හා අංශ

#### 1.2.6.1 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

2017 අංක 2 දරන සමෘද්ධි පනතින් සංශෝධිත 2013 අංක1 දරන දිවිනැගුම පනත මඟින් ස්ථාපිත මෙම ආයතනයට පැවරී ඇති ප්‍රධානම කාර්යය වන්නේ දිළිඳු පවුල් මිලියන 1.7 ට සමෘද්ධි සුබසාධනය සලසමින් සමාජ ආරක්ෂණ අරමුදල මඟින් එම පවුල්වල දෛනික වැදගත් අවස්ථාවලදී ආරක්ෂණය සැලසීමට අදාලව දීමනා ලබාදෙමින්, ශ්‍රී ලංකාවේ දිළිඳුකම මුලින් උපුටා දැමීම සඳහා එම පවුල් සවිබලගැන්වීමට ඔවුන්ගේ ජීවනෝපාය ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් සහ ප්‍රජාමූල බැංකු 1089 ක් මඟින් දිවයින පුරා විසිරී සිටින එම දිළිඳු පවුල්වල සහ අඩු ආදායම්ලාභී පවුල්වලට අවශ්‍යකරන විවිධ ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්පාදනය කිරීම වේ. මීට අමතරව, දිළිඳු පවුල් සහ අඩු ආදායම්ලාභී ජනතාව, ඒකරාශී කරමින් ප්‍රජාමූල සංවිධාන ජාලයක් ස්ථාපිත කොට පවත්වා ගෙනයාමත්, එම ජනතාව සමාජයීය වශයෙන් සවිබලගැන්වීම උදෙසා පහත සඳහන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් අරමුණු කෙරේ.

i. දිළිඳු පවුල් මිලියන 1.7 කගේ දෛනික පාරිභෝජන අවශ්‍යතා සපුරාලීම සඳහා මාසිකව ප්‍රධාන කාණ්ඩ 4ක් යටතේ (රු.4,500.00, රු.3,200.00, රු.1,900.00 හා රු.420.00 ආදී වශයෙන්) සමෘද්ධි සහනාධාර ලබාදීම.

ii. ඉහත දිළිඳු පවුල්වල, දරු උපත්, විවාහ, මරණ හා ළමයින්ගේ අධ්‍යාපනය යන අවස්ථාවන්ට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාදීම.

iii. සමෘද්ධි සහනාධාර ලබන පවුල්වල උසස් පෙළ හදාරන දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා එක් ශිෂ්‍යයෙකුට මසකට රු.1,500 බැගින් මාස 24 ක කාලයක් සඳහා ශිෂ්‍යත්ව ආධාර මුදලක් ලබාදීම.

iv. සමෘද්ධි සහනාධාරලාභී පවුල්වල ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා අවශ්‍යතාවයන් හඳුනාගෙන ඊට ගැළපෙන ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

v. ප්‍රජාමූල සංවිධාන 29,579, ප්‍රාදේශීය සංවිධාන 335 ක් සහ දිස්ත්‍රික් සංවිධාන 25ක් පිහිටුවීම තුලින් දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල් ඉලක්ක කරගත් ආර්ථික හා සමාජීය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

vi. දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල්වල ක්ෂුද්‍ර මූල්‍ය ණය අවශ්‍යතාවයන් හඳුනාගෙන, ඔවුන් සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1089 හා ප්‍රජාමූල බැංකු සමිති 334 හරහා අඩු පොලී ක්ෂුද්‍ර මූල්‍ය ණය සේවාවන් ක්‍රියාත්මක කිරීම සහ නිලධාරීන්ට ඉලක්ක ලබා දීම.

vii. නිවාස නොමැති දිළිඳු පවුල්වල නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා එක් පවුලකට රු. 200,000/= සිට රු. 600,000/= දක්වා මූල්‍ය ආධාරයක් ලබා දීම.

viii. දිළිඳු පවුල් මත් උවදුරින් බේරා ගැනීම සඳහා මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සමෘද්ධි පවුල්වල දරුවන්ගේ සාක්ෂරතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම, දුප්පත් ප්‍රජාවගේ මානසික ආතතිය වැළැක්වීම සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි වැඩසටහන් තුලින් දිළිඳු පවුල්වල සමාජ සංවර්ධනය ඇති කිරීමට ක්‍රියා කිරීම.

### 1.2.6.2 සමාජ සේවා දෙපාර්තමේන්තුව

ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ මූලිකත්වයෙන් 1944 වර්ෂයේ පත්කරන ලද කොමිෂන් සභාවේ නිර්දේශ මත 1948 පෙබරවාරි 01 වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලද අතර ආරම්භයේ දී දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය වූයේ අප රට තුළ ජීවත්වන වතු කම්කරුවන්, දිළිඳු පවුල් හා එම පවුල්වල සාමාජිකයින් විවිධ රෝගාබාධයන්ට ගොදුරු වන හා ආපදාවන්ට ලක්වන අවස්ථාවල දී මූල්‍යමය ආධාර සැපයීමයි.

ප්‍රාථමික අවස්ථාවේ පැවැති මෙම වැඩසටහන්, කාලීන අවශ්‍යතා මත යාවත්කාලීන කරමින් දෙන ලද සහනය යැපුම් මානසිකත්වයට සීමා නොකොට පුද්ගලයාගේ හෝ පවුලේ ජීවනෝපාය මාර්ග සංවර්ධනය ඇති කිරීම සඳහා පරිවර්තනය කරමින් වර්තමානයේ සමාජ සේවා විෂයභාර කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටු කරනු ලබයි.

ආන්තීකරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් රටේ ජන කොටස්වලට වඩාත් යහපත් වටපිටාවක් ගොඩනැගීමේ අරමුණින් යුතුව සමාජ සේවා දෙපාර්තමේන්තුව සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

**එම කාර්යයන් වන්නේ,**

i. ආබාධ සහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම, ස්වයං රැකියා සඳහා වෘත්තීය මෙවලම් ලබාදීම හා විවෘත වෙළඳපොල රැකියා වෙත යොමු කිරීම.

ii. ආබාධ සහිත වූවන් සඳහා රැකියා වෙළඳපොල හඳුනාගැනීම හා පුළුල් කිරීම.

iii. ආබාධ සහිත වූවන්ගේ කාලීන අවශ්‍යතා හා ප්‍රවණතා හඳුනා ගැනීම හා පර්යේෂණ කිරීම.

iv. විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා කල්තියා මැදිහත් වීම තුළින් ඔවුන් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා යොමු කිරීම.

v. ශ්‍රවණාබාධිත වූවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම හා සංඥා භාෂා පරිවර්තන සේවා ලබාදීම තුළින් ශ්‍රවණාබාධිත වූවන්ගේ එදිනෙදා කටයුතු පහසු කිරීම.

vi. භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා සහිත පිරිමි ළමුන් සඳහා ජීවිත කාලය පුරා රැකවරණය සැපයීම.

vii. ආබාධ සහිත පුද්ගලයින්ගේ සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන සඳහා මූල්‍යාධාර සැපයීම

viii. වයස අවු. 60 ට අඩු දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් සඳහා අක්ෂි කාච ලබාදීම හා වෛද්‍යාධාර සැපයීම දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා ක්‍රීඩා, අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහා ආධාර ලබා දීම, ඔවුන්ගේ ආයතන සඳහා යටිතල පහසුකම් සැපයීම හා වෙනත් සුභසාධන කටයුතු.

ix. ප්‍රජා මූලික පුනරුත්ථාපන සංවර්ධන වැඩසටහන යටතේ ආබාධ සහිත වූවන් සඳහා අවැසි සේවා සැපයීම.

x. ප්‍රාදේශීය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.

xi. මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 1.2.6.3 සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය

ග්‍රාමීය ජනතාව සෘජුව නිෂ්පාදන කාර්යයට සම්බන්ධ කර ගනිමින් ජාතික නිෂ්පාදනය වැඩි කිරීම පිණිස සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන හඳුන්වාදෙන ලදී. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය ස්ථාපිත කරනු ලැබූ අතර එක් එක් ගම්මානයන්හි පවතින සම්පත් සුලභතාවය, නිෂ්පාදන විභවතාව, වෙළඳපොල හා තිරසාරව ක්‍රියාත්මක කිරීමේ හැකියාව පදනම් කරගනිමින්, අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනය කරන හෝ සේවා සපයන ගම්මාන නිෂ්පාදන ගම්මාන ලෙස සංවර්ධනය කරනු ලබයි.

**අරමුණු**

i. දේශීය නිෂ්පාදන දිරිමත් කිරීම හා ප්‍රචලිත කිරීම
ii. පවතින සහ විශේෂිත නිෂ්පාදන දිරිමත් කිරීම
iii. රැකියා අවස්ථා උදා කිරීම මඟින් විරැකියාව අඩු කිරීම
iv. ග්‍රාමීය ආර්ථිකය නංවාලීම සඳහා විකල්ප ආදායම් මාර්ග ඇති කිරීම
v. ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම

**උපාය මාර්ග**

i. එක් නිෂ්පාදනයක් සඳහා යෙදවුම් වන වෙනත් අමුද්‍රව්‍ය, ඇසුරුම් ආදිය වෙනත් ගම්මාන තුළ නිෂ්පාදනය කිරීමට දිරිගැන්වීම
ii. ප්‍රතිලාභීන් සඳහා සෘජුව ලබාදෙන ප්‍රතිලාභ සඳහා 50% හෝ ඊට වැඩියෙන් ප්‍රතිලාභී දායකත්වයක් දැරිය යුතු වීම
iii. ප්‍රතිලාභී දායකත්වය මුදලින් මෙන්ම ප්‍රාග්ධන ස්වරූපයේ වෙනත් යෙදවුම් ලෙසද ලබාදිය හැකිවීම
iv. නිෂ්පාදන ගම්මානයේ සියළුම ප්‍රතිලාභීන් නිෂ්පාදන සමිතියේ සාමාජිකයින් වීම මඟින් එක් නිෂ්පාදන ඒකකයක් ලෙස ක්‍රියාත්මක වීමේ හැකියාව
v. නිෂ්පාදකයින්ට පොදුවේ පරිහරණය කල හැකි උපකරණ හා අනෙකුත් පහසුකම් නිෂ්පාදන සමිතියට ලබා දීම මඟින් වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබා ගැනීමට සැලසීම

### 1.2.6.4 ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය

1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමේ පනතට අදාළ විධිවිධාන සැලැස්වීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව හා ජාතික මහ ලේකම් කාර්යාලය පිහිටුවා ඇත. ඒ අනුව, ආබාධ සහිත තැනැත්තන් සඳහා හිතකර පරිසරයක් උදාකර දීම උදෙසා ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ සුභසාධනය ඇතුළු සහන සැලසීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

පිහිටුවා ඇත.එමෙන්ම ජාතික සභාව මඟින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මහ ලේකම් කාර්යාලය පිහිටුවා ඇත. එම ආයතනයේ ප්‍රධාන කාර්යයන් වන්නේ

i. ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරිමට, අභිසංවර්ධනය කිරිමට සහ ආරක්ෂා කිරිමට වගබලා ගැනීම,
ii. ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරිම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිම සහ අභිසංවර්ධනය කිරිම සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් සඳහා උපදෙස් දිම,
iii. අදාල අමාත්‍යාංශ, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මහලේකම් කාර්යාල, රාජ්‍ය හා පුද්ගලික අංශ සහ සංවිධාන විමසා ආබාධ සහිත තැනැත්තන්ගේ අර්ථ සිද්ධිය හා අයිතිවාසිකම් වැඩිදියුණු කිරිම ප්‍රවර්ධනය කිරිමට අවශ්‍ය සියළු පියවර ගැනිම.
iv. ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන් ආරක්ෂා කිරීම සඳහා වු යෝජනා ක්‍රම නිර්දේශ කිරිම,
v. ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වු යෝජනා ක්‍රම මුලාරම්භනය කිරීම සහ ක්‍රියාත්මක කිරිම,
vi. ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් වූ අදාළ ජාත්‍යන්තර ප්‍රකාශන සහ සම්මුති ආණ්ඩුව විසින් පිළිගනු ලබන බවට සහ අනුගමනය කරනු ලබන බවට වග බලාගැනිම,
vii. ආබාධ සහිත තැනැත්තන් සඳහා වඩා හොඳ ජීවන තත්වයක් ඇති කිරිමට වග බලාගැනිම,
viii. ආබාධ සහිත තැනැත්තන් රැකබලාගැනීම සඳහා පිහිටුවන ලද ආයතනවල කටයුතු සඳහා මඟපෙන්වීම, ඒවාට සහායදීම, එම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම,
ix. ආබාධ සහිත තැනැත්තන්ට පිවිසිය හැකිසේ භෞතික පරිසරය සකස් කිරීමේ වැඩපිළිවෙලවල් හඳුන්වාදීම සහ තොරතුරු ලබාගැනිමට සහ සන්නිවේදනයට ප්‍රවේශය, ආබාධ සහිත තැනැත්තන්ට ලබා ගත හැකි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරිම.

### 1.2.6.5 වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය

ශ්‍රී ලාංකික වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගිත්වය හා අභිමානය සහතික කරමින් වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කරලීම වෙනුවෙන්, 2011 අංක 05 දරන පනතින් සංශෝධිත 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මගින් සාමාජිකයින් 16කින් යුත් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත බලය පවරා ඇත. සභාවේ කර්තව්‍ය ඉටුකිරීමේදී ඊට සහාය වීම සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසා පත් කරනු ලබන සාමාජිකයන් 12 දෙනෙකුගෙන්, වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සමන්විත වන අතර නිල බලයෙන් සමාජ සේවා විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සභාපති ලෙසත්, එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා උපසභාපති ලෙසත්, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා ලේකම්

ලෙසත්, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා සාමාජිකයෙක් ලෙසත් පත් වේ. ඒ අනුව වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මුළු සාමාජිකයින් ගණන 16 කි.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 143 ක් වුවද 2022 වර්ෂයේ සිටි කාර්ය මණ්ඩලය 127 ක් වන අතර එය අධ්‍යක්ෂ, ගණකාධිකාරී(වැ.බ), අභ්‍යන්තර විගණක,පරිපාලන නිලධාරී(වැ.බ) යනුවෙන් මාණ්ඩලික නිලධාරීන් 04ක් ද, වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් 93 ක් ද, කළමනාකරණ සහකාර නිලධාරීන් 12ක් ද, සෙසු කාර්ය මණ්ඩල සාමාජිකයින් 18 කින් ද සමන්විත විය. වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු විසින් පරිපාලන නිලධාරී(වැ.බ) ලෙස කටයුතු කරනු ලබයි.

### අරමුණු හා ප්‍රධාන කාර්යයන්

වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිමේ පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ප්‍රධාන කර්තව්‍යය විය යුත්තේ ශ්‍රී ලංකාවේ සිටින වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා වැඩිහිටි තැනැත්තන්ට ආත්ම ගෞරවයක්, ස්වාධීනත්වයක් හා ගරුත්වයක් ඇතිව ජීවත්වීමට අවස්ථාව සලසා දීමයි.

## 1.2.6.6 ජාතික සමාජ සංවර්ධන ආයතනය

1992 අංක 41 දරණ පාර්ලිමේන්තු පනත යටතේ ස්ථාපනය කර ඇති ජාතික සමාජ සංවර්ධන ආයතනයෙහි ආරම්භය 1952 දි ස්වෙච්ඡා සංවිධාන කිහිපයක සහභාගිත්වයෙන් පිහිටුවා ගන්නා ලද "සමාජ වැඩ පිළිබඳ ආයතනයයි". 1964 දී මෙය රජයට පවරා ගනු ලැබීමත් සමඟ "ලංකා සමාජ සේවා විද්‍යාලය" ලෙස නම් කෙරිණි. එයින් පසුව ජාතික සමාජ සංවර්ධන ආයතනය 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ අංක 25A වගන්තිය යටතේ උපාධි පිරිනමන ආයතනයක් බවට පත්විය.
1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ සඳහන් කර ඇති පරිදි ආයතනයේ පහත සඳහන් අරමුණු ලගාකර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

i. වෘත්තිය සමාජ වැඩ අධ්‍යාපනය, සමාජ සුබසාධන කළමනාකරණය හා සමාජ සංවර්ධනය පිළිබඳ උසස් පාඨමාලා පැවැත්වීම, ප්‍රවර්ධනය හා ඒවා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මට්ටමකට ගෙන යාම.
ii. පුහුණු පාඨමාලා පුළුල් කිරිම, ශක්තිමත් කිරිම, සමාජ සුබසාධනය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරිමේ වෙනත් ආයතන සමඟ සහයෝගිත්වයෙන් ඒවා පැවැත්වීම, අඩු වරප්‍රසාද ලාභීන් බල ගැන්වීම, මානව කුසලතා හා වෘත්තිය කුසලතා සංවර්ධනය තුලින් පුද්ගලයන්ට හොඳ ජීවන මට්ටමක් ලබා දීම.
iii. සමාජ වැඩ අධ්‍යාපනය හා පුහුණුව, සමාජ සුබසාධනය හා සංවර්ධනයට අදාල පර්යේෂණ කටයුතු කිරීම, ප්‍රවර්ධනය හා පවත්වාගෙන යාම තුලින් සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ දියුණුව සැලසීම.

iv. සමාජ සුබසාධනය හා සමාජ සංවර්ධනය සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීමට, සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විශේෂ දායකත්වය සැපයීම.
v. ඉහත සියලුම අරමුණු සාර්ථකව ලඟා කර ගැනීමට අවශ්‍ය වන මූල්‍යමය අධ්‍යයන හා අනධ්‍යයන මිනිස් බලය හා විශේෂයෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනයට ස්ථිර ස්ථානයක් ස්ථාපනය කර යටිතල පහසුකම් ඇතුලු අනෙකුත් සම්පත් ලබා ගැනීම.

## 1.2.6.7 ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

1996 අංක 17 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනත මඟින් හා 1999 අංක 33 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල (සංශෝධිත) පනත මගින් ස්ථාපිතව කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්විම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයකි.

රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප්ලාභීන් නොවන සියලු දෙනා වෙත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සැලසීම මණ්ඩලයේ කාර්යභාරය වේ. මෙහිදී ස්වයං රැකියා නියුක්තිකයින්, පුද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්, විදේශ සේවා නියුක්තිකයින්, කලාකරුවන්, දේශීය වෛද්‍යවරුන් ආදී සෑම ක්ෂේත්‍රයක් සඳහාම සේවා සැපයීම මෙහි කාර්යභාරය වේ.

**අරමුණු**

i. ස්වයං රැකියා වල නියුතු තැනැත්තන්ට ඔවුන් වයෝවෘද්ධ කාලයේදී හෝ ඔවුන් යම් අශක්නුතාවයකට පත්වූ විට එම කාලයේදී ඔවුන්ට සමාජ ආරක්ෂණය සැලසීම.
ii. ස්වයං රැකියා වල නියුතු තැනැත්තන් මියගිය විට, ඔවුන්ගේ යැපෙන්නන්ට සහන සැලසීම.
iii. ස්වයං රැකියා වල නියුතු තැනැත්තන්ට ඔවුන්ගේ අදාල වෘත්තියවල යෙදෙන ලෙස දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩි දියුණු කිරීම.
iv. ස්වයං රැකියා වල යෙදෙන තරුණයන් දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩි දියුණු කිරීම.
v. සකසුරුවම් වීම හා සම්පත් කළමනාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දැනුවත් කිරීම.
vi. සාමාන්‍යයෙන් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම.

## 1.2.6.8 ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය, 1974 වර්ෂයේ දී ආරම්භ වී වර්තමානය වන විට කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. 1978 වර්ෂයේදී ග්‍රාමසංවර්ධනය හා දිළිඳුකම පිටු දැකීමේ ක්‍රමෝපයක් ලෙස, සංවර්ධන ප්‍රවාහයෙන් ආන්තීකරණයට ලක් වූ දිළිඳු ප්‍රජාව, ඔවුන් සතු විභව ශක්තීන් ඉස්මතු කරමින් ඔවුන්ගේ ස්වශක්තිය හා සාමූහිකත්වය වර්ධනය කිරීම සඳහා සහභාගිත්ව සංවර්ධන සංකල්පය මත පදනම් වූ විපර්යකාරක කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ වැඩසටහන තුළින් නව සංවර්ධන ක්‍රමවේදයක් හඳුන්වා දුන් ජාතික ආයතනයකි.

නිෂ්පාදනයේදී, අලෙවියේදී, පරිභෝජනයේදී සහ ණය ක්‍රියාවලියේදී මෙන්ම ජන ජීවිතයේ වෙනත් කාරණාවන්වලදී ද අඩු ආදායම්ලාභී ප්‍රජාව මුහුණපාන අවාසිදායක තත්වයන් වාසිදායක තත්වයන් බවට පරිවර්තනය කර ගැනීමට අවශ්‍ය බලගැන්වීමේ උත්ප්‍රේරණ ක්‍රියාවලිය මෙම ක්‍රමවේදයේ ප්‍රධාන කාර්යභාරයකි. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය ශ්‍රී ලංකාව තුළ ග්‍රාමසංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීමේ අරමුණින් ක්‍රියාත්මක සියලු ජාතික හා ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් සඳහා ගලපාලීමට මෙම ආයතනය මූලික වී ක්‍රියාත්මකව ඇත. මෙම ක්‍රියාකාරිත්වය තුළ කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ ක්‍රියාදාමය මූලික පදනම වූ අතර, එම කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ ක්‍රියාදාමය ඔස්සේ සංවර්ධනය කරන ලද පුහුණු මාදිළි භාවිත කර ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධන කාර්යයේ නියුතු රාජ්‍ය, රාජ්‍ය නොවන හා ප්‍රජා සංවිධාන වැඩකරුවන් අභ්‍යාසකරණයට යොමු කිරීම තුළින් ප්‍රජාව සවිබලගැන්වීම සඳහා යොමුගත කොට ඇත. එසේම වර්තමානය වන විට මෙම ආයතනය ප්‍රායෝගික කුසලතාවන්ගෙන් හා ශාස්ත්‍රීය ඥානයෙන් පිරි මානව සම්පත මෙන්ම, නවීන පහසුකම්වලින් සමන්විත දේශන ශාලා, නේවාසිකාගාර හා පුස්තකාල වැනි භෞතික පහසුකම්වලින්ද සමන්විත වේ. කොළඹ 08, කාසල් වීදිය, අංක 24/4 දරන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය හා පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වන අතර, ග්‍රාමසංවර්ධන මාවත, පිළිමතලාව යන ලිපිනයේද පුහුණු මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක වේ.

### 1.2.6.9 උපදේශන අංශය

එවකට කාන්තා අභිවෘද්ධි හා සමාජ සුබසාධන අමාත්‍යාංශය වශයෙන් ක්‍රියාත්මක වූ මෙම අමාත්‍යාංශය යටතේ 2003 වර්ෂයේ දී සමාජ සේවා නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් උපදේශන සේවාව ලබාදීම ආරම්භ කර ඇත.

ඉන්පසු 2004 වර්ෂයේ සිදු වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් මෙම අමාත්‍යාංශය යටතේ උපදේශන අංශය නමින් අංශයක් ස්ථාපිත කර 2005 වර්ෂයේ නව උපාධිධාරීන් බඳවා ගැනීම ජාතික ප්‍රතිපත්තිය අනුව, දෙපාර්තමේන්තු ගත තනතුරක් ලෙස "උපදේශන සහකාර" නමින් නිලධාරීන් බඳවා ගනිමින් උපදේශන මැදිහත්කරණ කාර්යය පුළුල් කර ඇත.

ඒ අනුව, වරින් වර විවිධ ප්‍රතිපත්ති යටතේ බඳවාගෙන මේ වනවිට සේවය කරන උපදේශන නිලධාරින් සංඛ්‍යාව 209 (මනෝවිද්‍යා උපදේශන නිලධාරීන් සංඛ්‍යාව 87 සහ සංවර්ධන නිලධාරී (උපදේශන) සංඛ්‍යාව 122) කි. ඔවුන්, අමාත්‍යාංයේ ප්‍රධාන කාර්යාලයටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලටත් අනුයුක්තව උපදේශන සේවා සැපයීම සිදු කරයි.

ප්‍රජාව මානසික ව්‍යාකූලතාවන්ට ගොදුරුවීම අවම කිරීම, උපදේශන ක්ෂේත්‍රයේ නව්‍යතාවයන් භාවිතා කරමින් ගුණාත්මක උපදේශන සේවාවක් සැපයීම, උපදේශන සේවයේ නියුතු වෘත්තිකයන් අතර විධිමත් සහසම්බන්ධතාවයක් ඇති කිරිම, උපදේශන සේවා ලබාදීම පිළිබඳ අධීක්ෂණය හා මඟපෙන්වීම මෙම අංශයේ අරමුණු වේ. ඒ යටතේ පහත සඳහන් කාර්යන් සිදුකරනු ලබයි.

i. ග්‍රාමීය ප්‍රජාව සවිබලගැන්වීම සඳහා උපදේශනය යොදාගැනීම හා උපදේශන වැඩසටහන් පැවැත්වීම.
ii. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ප්‍රජාව ආර්ථිකව සවිබලගැන්වීම සඳහා ගම්මානවල ප්‍රතිලාභීන් මානසිකව, ආර්ථික, සාමාජීයව හා ආධ්‍යාත්මිකව සවිබගැන්වීමට මනෝවිද්‍යාත්මක උපදේශන මැදිහත්කරණය සිදු කිරීම.
iii. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් උපදේශන සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම හා උපදේශන නිලධාරින් යෙදවීම.
iv. මනෝ සමාජයීය ගැටලු අවම කිරීම සඳහා සංවර්ධනාත්මක හා නිවාරණාත්මක උපදේශන වැඩසටහන් පැවැත්වීම.
v. ස්වභාවික හා මිනිසා විසින් ඇති කරන ලද ව්‍යසනයන්ට ගොදුරු වූ ප්‍රජාව සඳහා ව්‍යසන උපදේශන සායන හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
vi. මනෝවිද්‍යා උපදේශනය, මනෝ ප්‍රතිකාර හා එහි ප්‍රතිලාභ පිළිබඳ රාජ්‍ය නිලධාරින්, ප්‍රජා නායකයින්, පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ගුරුවරුන්, දෙමාපියන්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, යෞවන යෞවනියන් හා සමෘද්ධි ප්‍රතිලාභීන් දැනුවත් කිරීම තුළින් උපදේශන සේවා ව්‍යාප්ත කිරීම.
vii. උපදේශන සේවාව පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීම.
viii. උපදේශන සේවා අවශ්‍යතා ඇති රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට උපදේශන නිලධාරින්ගේ සේවය ලබාදීම (රෝහල්, බන්ධනාගාර, ළමා හා වැඩිහිටි නිවාස).
ix. උපදේශන සේවයේ සහාය ලබාගැනීමට අත්‍යවශ්‍ය නමුත් කාර්යාලගත නිලධාරියකු හමුවීමට නොහැකි තත්වයක දී හෝ අවස්ථාවක දී සේවය ලබා ගැනීමට පහසුකම් සැලසීම වෙනුවෙන් 24 පැය ජංගම දුරකථන උපදේශන සේවාවක් ක්‍රියාත්මක කිරීම.
x. උපදේශන සේවා සපයන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය කිරීම.
xi. උපදේශන විෂය ක්ෂේත්‍රය පිළිබඳ න්‍යායාත්මක හා දැනුම ප්‍රවර්ධනය සඳහා මුද්‍රිත ප්‍රකාශන නිකුත් කිරීම (සිංහල හා දෙමළ මාධ්‍ය)

### 1.2.6.10 පාලන අංශය

අමාත්‍යාංශයේ පරිපාලන, ආයතන, ප්‍රවාහන හා තොරතුරු තාක්ෂණ කටයුතු මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීම, අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතනවල පරිපාලන හා ආයතනික කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය පහත අරමුණු පෙරදැරිව සිදු කරයි.

i. අමාත්‍යාංශයට හා එම අංශයට අයත් සියළුම ආයතනවල කාර්ය මණ්ඩලයට අදාල ආයතනික හා පරිපාලන කටයුතු මෙහෙයවීම.
ii. දේශීය හා විදේශීය පුහුණුවීම් ලබාදීම තුළින් මානව සම්පත් හැකියා සංවර්ධනය කිරීම.

iii. අමාත්‍යාංශයේ විෂය පථයට අදාලව අමාත්‍ය මණ්ඩල සංදේශ,පනත්කෙටුම්පත් ආදිය නිසි පරිදි ඉදිරිපත් කිරිම මඟින් ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම.

iv. අමාත්‍යාංශයේ කාර්යයන් පවත්වා ගෙන යාමටඅවශ්‍ය මානව සම්පත් හා යටිතල පහසුකම් ලබා දීමට කටයුතු කිරිම.

v. අමාත්‍යාංශයට අයත් සියලුම ආයතන සම්බන්ධිකරණය කිරිම

vi. අමාත්‍යාංශයට අයත් නිලධාරින්ගේ මානව සම්පත් සංවර්ධන කුසලතා සංවර්ධනය කිරීම

අංක 02/2018 හා 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය තුළ කේන්ද්‍ර ගත වී පවත්නා මානව සම්පත කාර්යක්‍ෂමව, ගුණාත්මකව හා සඵලදායි ලෙස රටේ සංවර්ධනය සඳහා ප්‍රාග්ධනයක් ලෙස යොදා ගැනීම සඳහා සැලසුම් සහගත ලෙස සංවර්ධනය කිරීම පිණිස රාජ්‍ය ආයතනවල සේවය කරනු ලබන සමස්ත කාර්ය මණ්ඩලයේ එක් එක් නිලධාරීන් හට පැවරී ඇති විෂයන්වලට අදාළ රාජකාරි නිසි අයුරින් ඉටු කිරීම සඳහා ලබා දිය යුතු පුහුණු වීම් නිසි පරිදි හඳුනාගෙන එම පුහුණුවීම් නියමිත කාලය තුළ ලබා දීමත්, සියළුම නිලධාරීන් වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු වීම් සඳහා අවස්ථාව සැලසීමත් සියලු රාජ්‍ය ආයතන විසින් අනිවාර්යයෙන්ම සැපිරිය යුතු කටයුත්තක් ලෙස දක්වා ඇත.

එම අරමුණු සපුරාලීම පිණිසත්,සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්‍ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියාහා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනයන්හි දැක්ම, මෙහෙවර හා අරමුණු සාක්‍ෂාත් කර එහි කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිසත් රාජ්‍ය අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනයන්හි මානව සම්පත වටිනා ප්‍රාග්ධනයක් ලෙස සංවර්ධන කිරීම සඳහා නිලධාරීන්ගේ විෂයානුබද්ධ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය සහ ආධ්‍යාත්මික සංවර්ධනය මන් ඔවුන්ගේ සේවාවන් ඵලදායි, කාර්යක්‍ෂම හා ගුණාත්මක අන්දමින් යොදා ගැනීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

### 1.2.6.11 ගිණුම් අංශය

අමාත්‍යාංශයට අදාලව මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම, රාජ්‍ය ගිණුම් පවත්වා ගනිමින් විනිවිද භාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මගින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වා ගෙනයාම ගිණුම් අංශය මඟින් ඉටුකරන ප්‍රධාන කාර්යභාරය වේ.

මෙහි ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයාගේ සහ ප්‍රධාන ගණකාධිකාරීවරයාගේ මගපෙන්වීම, කළමනාකරණය, අධීක්ෂණය හා මෙහෙයවීම මගින් ගිණුම් කටයුතු සිදුවන අතර මුදල් රෙගුලාසි, විශේෂ විධි විධාන හා රජයේ චක්‍රලේඛ මගින් ලබාදී ඇති බලතල අනුව පහත සඳහන් කාර්යන්ද සිදුකරනු ලබයි.

i. අමාත්‍යාංශයට අයත් සමස්ත වාර්ෂික අයවැය ලේඛනය සකස් කර නියමිත දිනට ප්‍රථම ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.

ii. සියලුම ගණුදෙනු නිවැරදිව හා යාවත්කාලීනව ගිණුම් තැබීම හා ගිණුම් ඉදිරිපත් කිරීම.

iii. මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමට ඉහළ කළමනාකරණය වෙත සහාය වීම.

iv. සියලුම ලැබීම් හා වියදම් අධීක්ෂණය සහ වියදම් පාලනය.

v. වියදම් සමාලෝචනය සඳහා ඉහළ කළමනාකරණය වෙත යෝජනා ඉදිරිපත් කිරීම.

vi. මහා භාණ්ඩාගාර සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත අවසාන ගිණුම් ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණ කටයුතු කිරීම.

vii. සියලුම මිලදී ගැනීම් වලදී විනිවිදභාවයෙන් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් මූල්‍ය නීතිරීති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම හා සහය වීම.

viii. දිවයින පුරාම විහිදී ඇති සහනාධාර ලබන ප්‍රතිලාභීන්ගේ ප්‍රතිලාභ නියමිත දිනට සහ වේලාවට ඔවුන් වෙත ලබාදීම සඳහා සහාය ලබාදීම.

ix. අමාත්‍යාංශය යටතේ පවතින රජයේ වත්කම් යාවත්කාලීන කිරීම, ආදායම් එකතු කිරීම හා සුපරීක්ෂණය.

x. අමාත්‍යාංශයට අයත් ආයතන වල මූල්‍ය හා ගිණුම් කටයුතු නිවැරදිව පවත්වා ගෙන යාමට සහාය වීම.

## 1.2.6.12 අභ්‍යන්තර විගණන අංශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 වගන්තිවල සඳහන් රාජකාරී හා අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශයෙහි උපදෙස් මෙන්ම 2018 අංක 19 දරණ විගණන පනතේ VII කොටසෙහි 40 වගන්තිය අනුව අමාත්‍යාංශ ලේකම් වෙත ඍජුව වාර්තා කිරීම සඳහා බැඳී සිටින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා යටතේ ක්‍රියාත්මක වේ.

එමෙන්ම ආයතනයේ අරමුණු කරා ලගාවීමේදී මූල්‍ය සැලසුම්කරණ, අභ්‍යන්තර පාලන පොත්පත් හා ගිණුම් නිසිපරිදි පවත්වාගෙන යාම, මුල්‍ය කළමනාකරණය හා කළමනාකරණ තොරතුරු සැපයීමේ ක්‍රමවේදය සඵලදායී ලෙස සිදුවන බවට සහතික වීම මෙම අංශයේ අරමුණ වේ.

## 1.2.6.13 සැලසුම් හා මෙහෙයුම් අංශය

අමාත්‍යාංශයේ සමාජ සවිබල ගැන්වීම් අංශය සහ ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, ක්‍රියාත්මක වැඩසටහන් මෙහෙයවීම සහ ප්‍රගති පාලනය සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධීකරණ කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාර්ය වේ.

### 1.2.6.14 සංවර්ධන අංශ (I, II, III)

සංවර්ධන අංශ 3 ක් ලෙස ක්‍රියාත්මක වන අතර එම ආයතනයන්හි ප්‍රධානියා අතිරේක ලේකම්වරයෙකි. අමාත්‍යාංශයේ සමාජ සවිබල ගැන්වීම් අංශය යටතේ ඇති දෙපාර්තමේන්තු , ආයතන හා අංශ මඟින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් පිළිබඳව අධීක්ෂණය, මඟපෙන්වීම හා අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කිරීම මෙම අංශයන්හි ප්‍රධාන කාර්යභාර්ය වන අතර පහත පරිදි සංවර්ධන අංශ සඳහා ආයතන බෙදී ගොස් ඇත.

- සංවර්ධන අංශය I - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
  සමාජ සේවා දෙපාර්තමේන්තුව
- සංවර්ධන අංශය II - අබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව හා ජාතික මහ ලේකම් කාර්යාලය
  වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය
  සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය
- සංවර්ධන අංශය III - ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
  ජාතික සමාජ සංවර්ධන ආයතනය
  ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
  උපදේශන අංශය

# පරිච්ඡේදය 02

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 කාන්තා හා ළමා කටයුතු අංශය

### 2.1.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

**විශේෂ**

1. ගර්භනී හා කිරිදෙන මව්වරුන්ට රුපියල් 20,000/- ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
2. පෙරපාසල් දරුවන්/මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාරවේලක් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
3. පෙරපාසල් ගුරුවරියන් සඳහා මාසික දීමනාවක් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
4. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ අනෙකුත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
5. මුල් ළමාවිය සංවර්ධන තක්සේරුකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් සඳහා ඉගෙනුම් කට්ටල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
7. ‘‘අරුණ දකින රටා’’ මුල් ළමාවියේ දරුවන්ගේ සිතුවම් ප්‍රදර්ශනය සහ වැඩමුළු පැවැත්වීම.
8. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික කමිටු රැස්වීම් පැවැත්වීම. (මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳව ජාතික කමිටුව මානව සම්පත් සංවර්ධනයේ වැදගත් කාලසීමාවක් වන මුල් ළමාවිය සංවර්ධන අවධිය සම්බන්ධයෙන් සුවිශේෂී අවධානයක් යොමුකරමින් මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අවසන් කර ඇති බැවින් මෙම අධ්‍යාපන ප්‍රතිපත්තිය පිළිබඳව සියලුම පළාත් ලේකම්වරුන්, ජාතික කමිටු සාමාජිකයින්, පළාත් පෙර පාසැල් ඒකක ප්‍රධානීන් සහ සියලු පාර්ශවකරුවන් දැනුවත් කිරීමට අදාළව 2022.09.12 දින සිදුකරන ලද කමිටුව සඳහා රු.මි. 0.074ක් වැයවී ඇත.)
9. නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
10. "සෙනෙහෙ තටාක" දෙමාපියන් දැනුවත් කිරීම සඳහා සහභාගීත්ව නව සංකල්ප අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
11. “මාතෘ අභිමාණී” වැඩසටහන් පැවැත්වීම.
12. ඒකාබද්ධ ළමා හා කාන්තා ආදර්ශ ගම්මාන පිහිටුවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
13. හදිසි ආපදා අවස්ථාවන්හිදී මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ කටයුතු සිදු කිරීම.
14. ළමයින් සඳහා වන සමාජ ආරක්ෂණ අරමුදල (Save the Children Fund) යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

| ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) (2022.12.31 දක්වා ) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය (2022.12.31 දක්වා ) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ගර්භනී හා කිරිදෙන මව්වරුන්ට රුපියල් 20,000/- ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන | 4000.00 | 3690.130 | 2000000 පෝෂණ මළු | 1583179 (ආසන්න වශයෙන් බෙදී ගිය පෝෂණ මළු සංඛ්‍යාව) | ආසන්න වශයෙන් ගැබිණි මව්වරුන් 158317 |
| පෙර පාසල් දරුවන්/මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාර වේලක් ලබා දීමේ වැඩසටහන | 150.00 | 147.753 | පෙර පාසල් දරුවන් 90203 | පෙර පාසල් දරුවන් 76964 | පෙර පාසල් දරුවන් 76,964 |
| පෙර පාසල් ගුරුවරියන් සඳහා මාසික දීමනාවක් ලබාදීමේ වැඩසටහන - "ගුරු අභිමාණී"- මාසිකව රුපියල් 2500/- යන වැඩසටහන් | 500.00 | 445.639 | පෙර පාසල් ගුරුවරියන් 16275 | පෙර පාසල් ගුරුවරියන් 15726 | පෙර පාසල් ගුරුවරිය න් 15726 |

15. ජාතික කාන්තා කමිටුව රජයේ නීතිගත ආයතයක් බවට පත් කිරීම.
16. තරුණ මව්වරුන්ගේ දායකත්වය රටේ සංවර්ධනය උදෙසා යොදා ගැනීම මෙන්ම ළමා වියෙහි දරුවන්ගේ පෝෂණය, පෞරුෂ වර්ධනය හා ආරක්ෂාව තහවුරු වන ක්‍රමෝපායන් සහිත ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම ප්‍රධාන අරමුණ කරගත් ප්‍රතිපත්තිමය සාකච්ඡාවන් පැවැත්වීම.
17. ආර්ථික වශයෙන් ශක්තිමත් වීම උදෙසා විදේශගත කාන්තාවන්ගේ පවුල්වල සුරක්ෂිතතාවය තහවුරු කිරිම සඳහා ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම.
18. සතුටු පවුල වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
19. කාන්තාවන්ට එරෙහිව සිදුවන සියලුම ආකාරයේ හිංසනයන් පිටුදැකීම සඳහා වන අන්තර්ජාතික දින 16 වැඩසටහන හා ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන් පැවැත්වීම.
20. උද්දේශන/දැනුවත් කිරීම් සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. (කාන්තා හිංසන සිද්ධීන් සම්බන්ධව ක්‍රියා කිරීමේ දී පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම, පොදු ප්‍රවාහනයේදී සිදු වන හිංසනයන් අවම කිරීමේ 'සැමට සුන්දර ගමනක්' වැඩසටහන් මාලාව, විගාමික කාන්තාවන්ගේ පවුල්වල ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන්, ජාතික තරුණ සේවා සභාව හා ඒකාබද්ධව ලිංගික අධ්‍යාපනය ලබාදීමේ වැඩසටහන්, උපකාරක පන්ති ඇතුලු උසස් අධ්‍යාපන ආයතන ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් (සයිබර් අපරාධ, පොදු ප්‍රවාහනයේ දී සිදු වන හිංසන, ප්‍රජනන සෞඛ්‍ය අධ්‍යාපනය), පූර්ව විවාහ උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වින්දිත කාන්තාවන්ගේ

කුසලතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සේවා ස්ථානයේ සිදුවන ප්‍රචණ්ඩත්වයට එරෙහිව නැඟී සිටීම පිළිබඳ සේවකයින්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වතු ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම)

21. කාන්තා දේශපාලන සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම.
    - ✓ පාර්ලිමේන්තු හා පළාත් සභා මැතිවරණයන්හිදී කාන්තාවන් සඳහා කෝටාවක් ලබාදීමට කටයුතු කිරීම
    - ✓ පළාත් පාලන ආයතන නියෝජිතයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

## ජයග්‍රහණ

1. ළමා හා කාන්තා ක්ෂේත්‍රය තුළ අමාත්‍යාංශ සේවාවන් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා සැලසුම්කරණය හා තොරතුරු තාක්ෂණ භාවිතාවන් ශක්තිමත් කිරීම හා ජාතික මට්ටමේ සිට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටම දක්වා මෙහෙයුම් හා ඇගයුම් ක්‍රමවේද ක්‍රියාවට නැංවීමට හැකිවීම.
2. සුහුරුලිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
3. ඊ - පොළ - මාර්ගගත අලෙවිකරණ වේදිකාව
4. ආසියානු සංවර්ධන (ADB) ව්‍යාපෘතිය කාන්තා හා ළමා අංශය වෙනුවෙන් සම්බන්ධීකරණය.
5. සුනිසි මෙහෙවර සේවා ස්ථාන
6. 2023 – 2027 කාලසීමාව සඳහා ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය අවම කිරීම ආමන්ත්‍රණය කිරීම සඳහා පස් අවුරුදු දෙවන ජාතික ක්‍රියාකාරී සැලැස්ම අදාළ පාර්ශව සහභාගීත්වයෙන් සකස් කිරීම 2022 වර්ෂයේදී ආරම්භ කර ඇත.
7. පාර්ලිමේන්තුවේ කාන්තා සංසදය හරහා අමාත්‍යාංශයට ප්‍රවේශවිය නොහැකි ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කිරීම හා එතුළින් අදාළ තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම.
8. පළාත් සභා හා ජාතික මට්ටමේදී කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා උපායමාර්ග යෝජනා කර තිබීම.

## අභියෝග

1. සියලු සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය විද්‍යුත් දත්ත පද්ධතියක් හරහා ලබාගැනීම.
2. 2022 වර්ෂයේ දී ශ්‍රී ලංකාව මුහුණ දුන් ආර්ථික අර්බුදය සමඟ ජාතික කාන්තා කමිටුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ක්‍රියාකාරකම් අපේක්ෂා කළ කාල සීමව තුළ සිදු කිරීමට අපහසු විය. නමුත් වර්ෂය අවසානය වනවිට සංශෝධන සහිතව ක්‍රියාකාරී සැලැස්මෙහි බොහෝමයක් වැඩසටහන් සිදුකර අවසන් කිරීමට හැකිවිය.
3. වර්තමානයේ දී සාමාජීය වෙනස්වීම් කරණකොට ගෙන දරුවන් හා කාන්තාවන් උදෙසා පවතින අවධානය, සුරක්ෂිතතාවය සහ සංවේදීතාවය අඩු වෙමින් පවතී. මේ තත්ත්වය යටතේ වඩාත්ම අවධානමට ලක් වන්නේ දරුවන් හා කාන්තාවන් වීම.

4. 2021 වර්ෂයේ සිට මේ දක්වා ඇති වූ කොවිඩ් (Covid 19) වසංගත තත්ත්වය හා රටේ පවත්නා මූල්‍ය අර්බුදය හමුවේ සැලසුම් කළ යම් යම් ක්‍රියාකාරකම් නිසියාකාරව ඉටු කිරීමට අපහසු විය. එමෙන්ම 2023 වර්ෂයේදී රට තුළ පවතින ආර්ථික තත්ත්වයද මනාව අවබෝධ කරගනිමින් සංවර්ධන වැඩසටහන් සඳහා ලැබී ඇති රාජ්‍ය ප්‍රතිපාදන අවම මට්ටමක පැවතියද ඒවා වඩාත් ඵලදායීව හා අවශ්‍යතාවයන් නිවැරදිව නිශ්චය කොටගෙන කාන්තාවන්ගේ හා දරුවන්ගේ අභිවෘද්ධිය පිණිස යෙදවීම අභියෝග සහගත වේ.
5. තවද කාන්තාවන්ගේ හා දරුවන්ගේ යහපැවැත්ම හා ආරක්ෂාව තහවුරු කරනු වස් සිදුකළ යුතු අනිවාර්ය සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන රාජ්‍ය නොවන පාර්ශවයන්ගෙන් හෝ අනුග්‍රාහක භවතුන්ගෙන් හෝ දායකත්වය මත සපයා ගැනීම පිණිස වෑයම් කිරීම අවශ්‍ය වී තිබේ.

## ඉදිරි ඉලක්ක

1. ජාතික කාන්තා කමිටුව ස්වාධීන ආයතනයක් බවට පත් කිරීම
2. පාර්ලිමේන්තු හා පළාත්සභා මැතිවරණයන්හි දී කාන්තාවන් සඳහා කෝටාවක් ලබාදීම
3. තරුණ මව්වරුන් සඳහා නම්‍යශීලී වැඩ පරිසරයක් ඇති කිරීම
4. ගෘහස්ථ හිංසන පනත පිළිබඳ ප්‍රජාවගේ දැනුවත්භාවය වර්ධන කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම
5. සයිබර් අපරාධ සම්බන්ධව තරුණ ප්‍රජාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීම තුළින් සයිබර් අපරාධ අවම කිරීමට ක්‍රියා කිරීම
6. පාසල් තුළ උපදේශනය සපයන ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළ ඔවුන්ගේ සේවාව වඩාත් කාර්යක්ෂම කිරීම හා ඵලදායි කිරීම.
7. දැනට කෙටුම්පත් සකස් කර ඇති ජාතික කාන්තා කොමිසම පනත (National Commission on Women Act), කාන්තාවන් සවිබල ගැන්වීම (empowerment of women Act) සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතා පනත (Gender Equality Act) සකස් කොට බලාත්මක කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකරමින් සිටින අතර 2023 වර්ෂය තුළ එය සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.
8. අමාත්‍යාංශයීය ක්ෂේත්‍ර නිළධාරීන් වෙනුවෙන් දැනට කෙටුම්පත් කර ඇති අවදානම් සහගත දරුවන් සිතියම්ගතකරණය පිළිබඳ මාර්ගෝපදේශයද භාවිතයෙන්, අවදානම් තත්ත්වයේ පසුවන දරුවන් කල්වේලා ඇතිව හඳුනාගෙන ඔවුන් ඒ තත්ත්වයෙන් මුදවාලීමට අවශ්‍ය සේවා සැපයීමේ අඛණ්ඩ වැඩපිළිවෙලක් සාර්ථකව දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට අපේක්ෂිතය.
9. ස්වකීය අභිවෘද්ධිය හා ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා ස්වයංව නැගී සිටිය හැකි පරිදි ශක්තිමත් පෞරුෂයෙන් යුතු ප්‍රජාවක් ගම් මට්ටමින් බිහි කරලීම උදෙසා ප්‍රජා බලගැන්වීමේ සංකල්පය අප ක්ෂේත්‍ර නිළධාරීන් හරහා ගම්මාන 50 ක පමණ බිම් මට්ටමේ ජනතාව වෙත හඳුන්වා දෙමින් සිටින අතර එය තව දුරටත් ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ.

10. මීට අමතරව ආසියානු සංවර්ධන බැංකුවෙහි ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය සංවර්ධන ප්‍රතිපාදන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ 2023 සිට 2024 වර්ෂය දක්වා "ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් සඳහා සහාය සේවා යාන්ත්‍රණය හා යොමුගත කිරීමේ පද්ධතිය" බලගැන්වීමටත් එමඟින් අවදානම්කාරී පවුල් ග්‍රාමීය මට්ටමින් හඳුනාගැනීමෙන් ගෘහස්ථ හිංසනයෙන් හා ප්‍රචණ්ඩත්වයෙන් මුදවා ගැනීමට මහනුවර හා කෑගල්ල දිස්ත්‍රික්ක ආශ්‍රිතව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එමෙන්ම මෙම ආධාර යටතේ අධි අවදානම් දරුවන් සිතියම්ගත කිරීමේ මාර්ගෝපදේශයක් එළිදැක්වීමටත් තෝරාගත් දිස්ත්‍රික්ක දෙකක සියලුම දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලෙකම් කාර්යාලයන්හි නියමු ව්‍යාපෘතීන් සිදු කිරීමටත් සැලසුම් කර ඇති අතර ඇස්තමේන්තුගත මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු. මි. 17කි
11. පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් අතර කාන්තාවගේ දායකත්වය වර්ධනය කිරීම.
12. දැනුම කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩ නැඟීම සඳහා මානව සම්පත සංවර්ධනය කිරීම.
13. රැකියාවට නොයන කාන්තාවන්ට විවිධ ව්‍යවසායන්ට යොමුවීම සඳහා අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා ව්‍යාපාරික පුහුණුව හා වෙළඳපොළ සම්බන්ධීකරණයට නිසි ක්‍රමවේද රාජ්‍ය මැදිහත් වීමෙන් සකස් කිරීම.
14. නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමවලින් පීඩනයට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහනයක් ලබාදීම.
15. කාන්තා සුරක්ෂිතතාවය තහවුරු කිරීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.
16. නිතර ආපදා අවදානමට ලක්වන පුද්ගලයන්ට විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන්ට රැකවරණය හා පහසුකම් සැලසීමටත්, දුෂ්කරතා අවම කිරීමටත් ස්ථිර වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.
17. නීරෝගී දරුවෙකු බිහි කිරීම, මව් සෙනෙහස තුළ දරුවන් රැක බලා ගැනීම හා දරුවන්ට මඟ පෙන්වීම සඳහා කාන්තාවන්ට අවශ්‍ය දැනුම/කුසලතා හා කාලය ලබාදීම සඳහා ක්‍රමවේදයන් ස්ථාපනය කිරීම.
18. ගෘහමූලික කාන්තාවන් හා විදේශගතවන කාන්තාවන් සඳහා ආරක්ෂිත හා විකල්ප ආදායම් මාර්ග ක්‍රියාත්මක කිරීම.
19. පෙර පාසල් ලියාපදිංචි කිරීම සහ පෙර පාසල් තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා කළමණාකරණ තොරතුරු පද්ධතිය සකස් කිරීම (අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධ ව්‍යාපෘතියකි.)

## 2.2 සමාජ සවිබල ගැන්වීම් අංශය

### 2.2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

#### I. සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. | 1,350.00 |
| වියදම රු.මි. | 1,271.38 |

**භෞතික ප්‍රගතිය**

i. නව නිෂ්පාදන ගම්මාන 2 ක් ඇති කිරීම සහ දැනට පවතින නිෂ්පාදන ගම්මාන 21 ක් සංවර්ධනය කිරීම

ii. ගුවන්විදුලි වැඩසටහන් 04 ක් පැවැත්වීම.

iii. 2021 වසරේ ක්‍රියාත්මක වැඩසටහන් සඳහා රු.මි 1240.12 ක අතැති බිල්පත් ගෙවීම.

**විශේෂ ජයග්‍රහණ**

2022 වර්ෂයේදී ද දිවයිනෙහි බල පැවති කොරෝනා වසංගතය සහ ආර්ථික අරබුද මධ්‍යයේ වුව ද ආයතන රැසක සම්බන්ධීකරණයෙන් කළ යුතු වැඩසටහනක් වූ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ස්ථාපිත කිරීම සිදු කරනු ලැබිණි. එසේ ස්ථාපනය කරන ලද නිෂ්පාදන ගම්මාන අතරින් ඇතැම් නිෂ්පාදන ගම්මාන මේ වන විටත් අපනයන වෙළඳපල සඳහා තම නිෂ්පාදන සාර්ථකව ඉදිරිපත් කරන ලබනු අතර පවතින ආනයන සීමා කිරීම් හමුවේ ආනයන ආදේශන දේශීය වෙළඳපල වෙත ලබා දීම මඟින් නිෂ්පාදකයින් මෙන්ම පාරිභෝකයින්ට ද සහන සැලසී ඇත.

දේශීය හා විදේශීය වෙළෙඳපොළ වෙත නිෂ්පාදන ගම්මාන වැඩසටහන සහ එම නිෂ්පාදන හඳුන්වා දීම සඳහා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම ද 2022 වර්ෂයේ දී සිදු කරන ලද අතර මෙමඟින් පුළුල් ප්‍රචාරයක් වැඩසටහන සඳහා ලබාදීමට හැකියාව ලැබුණි.

**අභියෝග**

පසුගිය වසර තුල දිවයිනෙ හි පැවති සමාජ ආර්ථික තත්ත්වයන් යටතේ රාජ්‍ය වියදම් අඩු කිරීමට ලැබුණු උපදෙස් අනුව කටයුතු කිරීමට සිදුවීම මඟින් සැලසුම් කල අයුරින් ම නිෂ්පාදන ගම්මාන ස්ථාපිත කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධන වැඩසහටහන් පැවත්වීම සිදු කිරීමට නොහැකිවීම

### ඉදිරි ඉලක්ක

- නව නිෂ්පාදන ගම්මාන ස්ථාපනය කිරීම හා පසුගිය වසර තුල දී ස්ථාපනය කරන ලද නිෂ්පාදන ගම්මාන සඳහා අත්‍යවශ්‍ය වන වැඩිදියුණු කිරීම් සිදු කිරීම

(නව නිෂ්පාදකයින් වැඩසටහනට ඇතුලත් කර ගැනීම, නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට හා නිෂ්පාදන ධාරිතාව ඉහල නැංවීමට ඉවහල් වන නව යන්ත්‍රෝපකරණ ලබා දීම, නව තාක්ෂණය හා පුහුණුව ලබා දීම)

- නිෂ්පාදන ගම්මාන වැඩසහටන සඳහා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම

(නිෂ්පාදන දේශීය හා විදේශී වෙළඳපොළ වෙත යොමු කිරීම උදෙසා වඩාත් පුළුල් ප්‍රචාරණයක් ලබාදීම,නිෂ්පාදන ගම්මාන සඳහා නව වෙළදපල විවර කරදීම)

## II. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය

| | මුළු වාර්ෂික ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|
| ප්‍රාග්ධන | 32.00 | 32.00 |
| පුනරාවර්තන | 7,520 | 3,317.61 |

**1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමේ නව පනත් කෙටුම්පත**

මෙම පනත වර්තමාන සමාජ රටාවට අනුරූප වෙමින් ආබාධ සහිත ප්‍රජාව වෙනුවෙන් උපරිම සාධාරණයක් ඉටු කිරීම සඳහා නැවත සංශෝධන කිරීමේ කටයුතු සිදු කරමින් නව පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

### සංඥා භාෂා පනත් කෙටුම්පත

සංඥා භාෂාව පිළිගත් සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශයේ නිරීක්ෂණයන්ට අනුකූලව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව මඟින් සකස් කරන ලද සංඥා භාෂා පනත් කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුවේ නිශ්කාශන සහතිකය ලබාගැනීම සඳහා යොමු කොට ඇත.

### ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය

රජයේ ගොඩනැඟිලි, ප්‍රසිද්ධ ස්ථාන හා සේවාවන් සහිත ස්ථාන ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට සකස් කරනු පිණිස 2006.10.17 හා අංක 1467/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය හා එය සංශෝධනය කරමින් නිකුත් කර ඇති අංක 1619/24 හා 2009.09.18 දින දරණ අති විශේෂ ගැසට් නිවේදනය වර්තමානයේ පවතින තත්ත්වයන්ට ගැළපෙන පරිදි නැවත සකස් කිරීමට කටයුතු කරමින් පවතී. අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් හරහා සංශෝධන සිදු කරමින් පවතී.

### රැකවරණ මධ්‍යස්ථාන 03ක් ස්ථාපනය කිරීම

දීප ව්‍යාප්තව රැකවරණ මධ්‍යස්ථාන 6ක් ඉදි කිරීම සඳහා අමප/18/0755/711/015 අංක දරණ පත්‍රිකාව මඟින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මේ වන විට ගම්පහ - මීරිගම, මාතලේ - දඹුල්ල ලෙස ඉඩම් හඳුනාගෙන පවරා ගැනීමට කටයුතු සිදු කරමින් සිටී. මාතර අකුරැස්ස මධ්‍යස්ථානයෙහි ඉදිකිරීම් කටයුතුවල අවසන් අදියරේ ඇත.

### අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන් සඳහා රු.5000/- මාසික ජීවනාධාර දීමනාව ලබා දීම

අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම දීමනාව ලබා දෙන අතර ජනවාරි සිට අප්‍රේල් දක්වා හා දෙසැම්බර් මාස වල භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ගෙවීම් සිදු කරන අතර එහි ප්‍රගතිය පහත පරිදි වේ.

- වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය - රු.මි 4860
- වැය කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය - රු.මි 2,153
- ප්‍රතිලාභින් සංඛ්‍යාව - 72,000

මැයි සිට ජූලි දක්වා ලෝක බැංකු අරමුදල් යටතේ ද සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර යටතේ මෙම ගෙවීම් කටයුතු සිදු කර ඇත. එහි ප්‍රගතිය පිටු අංක 52 මඟින් ඉදිරිපත් කර ඇත.

### වික්ටෝරියා නිවාසය පවත්වාගෙන යාමට ආධාර ලබා දීම

ඇඳගත රෝගීන් 147 පමණ සඳහා සේවා සපයන රාජගිරිය වික්ටෝරියා නිවාසයේ සේවක වැටුප් හා දීමනා, ජල, විදුලි හා දුරකථන බිල්පත් ගෙවීම වෙනුවෙන් මසකට රු.මි. 0.666 බැගින් වර්ෂයට රු.මි 8 ක මුදලක් ලබාදීමට කටයුතු කර ඇත.

### අඩුආදායම්ලාභී වකුගඩු රෝගීන් සඳහා රු.5000/- මාසික ජීවනාධාර දීමනාව ලබා දීම

මූලය හඳුනා නොගත් කාලික වකුගඩු රෝගීන් සඳහා මාසික දීමනා ගෙවීම 2015 වසරේ සිට ක්‍රියාත්මක වේ. රු.3000/- මාසික ජීවනාධාරයක් වශයෙන් ආරම්භ කරන ලදුව වර්තමානයේ රු.5000/- මාසික ජීවනාධාරයක් වශයෙන් ක්‍රියාත්මක වේ.

සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නිර්දේශිත කාලික වකුගඩු රෝග ව්‍යාප්ත දිස්ත්‍රික්ක 11 තුළ හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 84 ක රෝගීන් සඳහා මෙම දීමනාව ගෙවන ලදී. 2020 සැප්තැම්බර් මාසයේ සිට දිවයිනම ආවරණය වන පරිදි, සියලුම වර්ගයේ වකුගඩු රෝගවලින් පෙළෙන ප්‍රතිලාභීන් 39,169ක් සඳහා ගෙවීම් සිදු කිරීමට හැකි විය. 2022 මැයි, ජුනි, ජූලි මාස සඳහා ලෝක බැංකු ව්‍යාපෘතිය

යටතේ වකුගඩු ආධාර ලබන දීමනාලාභීන් සඳහා රු. 5000/- ක නිත්‍ය දීමනාවට අමතරව රු. 2500/- ක අතිරේක දීමනාවක් සහ පොරොත්තු ලේඛන ගත අය සඳහා රු. 5000/- ක දීමනාවක් ලබා දීමට කටයුතු කරන ලදී. එසේම ආසියානු සංවර්ධන බැංකුව මඟින් සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් මාස 03 සඳහා ද ඉහත දීමනාවන් ලබා දීමට කටයුතු කරන ලදී. ඊට අදාළ ගෙවීම් පිළිබඳ විස්තර පිටු අංක 53 මඟින් ඉදිරිපත් කර ඇත.

## ආබාධ සහිත තැනැත්තන් සඳහා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා ලබා දීම

රැකියාවක නියැලිය හැකි මට්ටමක සිටින ආබාධ සහිත තැනැත්තන් සඳහා පෞද්ගලික අංශයේ රැකියාවක් සඳහා යොමු කරන අතර, එම ආයතනය ගෙවනු ලබන මූලික වැටුපෙන් 50% (උපරිමය රු.15,000ක් වන පරිදි) මාස 24ක් සඳහා මෙම කාර්යාලය මඟින් ගෙවීමට කටයුතු කරනු ලැබේ. එහිදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආබාධ සහිත තැනැත්තන් හඳුනා ගැනීම, රැකියා සැපයීමට එකඟත්වය පළ කරන පෞද්ගලික ආයතන සම්බන්ධීකරණය වැනි කාර්යයන් සිදු කරන ලදී. ඒ අනුව, සියලු දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සාකච්ඡා මඟින් මෙන්ම චක්‍රලේඛයක් මඟින් ද දැනුවත් කර ඇති අතර, ගිවිසුමක් මඟින් පෞද්ගලික ආයතන සම්බන්ධීකරණය කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව හඳුනා ගත් ආබාධ සහිත තැනැත්තන් 105 ක් පමණ 2020 වසරේ දී රැකියා ගත කිරීමට කටයුතු කරන ලදී. නමුත් රටේ පැවති ආර්ථික අර්බුදය මෙන්ම වසංගත රෝගයත් හේතුකොටගෙන පෞද්ගලික අංශයේ නව බඳවා ගැනීම් සීමා සහිත වීමත්, පැවති ආයතන වැසීයාමත් හේතුවෙන් වර්ෂය අවසන් වන විට ප්‍රතිලාභීන් සංඛ්‍යාව 01 කට සීමා විය. නව රැකියා අවස්ථා සඳහා ඉල්ලීම් විශාල සංඛ්‍යාවක් මේ වන විට ලැබී ඇත. රැකියා ලබා දීම සම්බන්ධයෙන් පෞද්ගලික ආයතන සමඟ සාකච්ඡා කරමින් සිටී. 2023 වර්ෂයේ දී විශාල සංඛ්‍යාවකට රැකියා පුහුණු අවස්ථා ලබා දීමට අපේක්ෂිතය.

| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| **105** | 10 | 2.77 |

## වෛද්‍ය ආධාර ලබා දීම

රජයේ රෝහලින් නොසපයන ඖෂධ ලබා ගැනීමට,සායනවලට සහභාගී වීම සඳහා හා හෘද, අක්ෂි, වකුගඩු, මොළය, උකුල් ඇට, කර්ණ පටක බද්ධය ආදී ඕනෑම සැත්කමක් සඳහා අවශ්‍ය වන වියදම් පියවා ගැනීමට අඩු ආදායම්ලාභී පවුල් සඳහා උපරිමය රු.20,000ක් දක්වා මේ යටතේ ආධාර ලබාදේ. කොවිඩ් 19 වසංගතය සහ රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් සැලසුම් කළ ජංගම සේවා පැවැත්විය නොහැකිව එම වැඩසටහනේ ඉතිරිව පැවති ප්‍රතිපාදන, මුද්‍රණ කටයුතු සිදු නොකිරීම නිසා ඉතිරි වූ ප්‍රතිපාදන, රටේ පැවති අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් රැස්වීම් පැවැත්වීම සීමිත වීම හා zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීම හේතුවෙන් වෙනත් හා පරිපාලන වියදම් වල ඉතිරිවීම්, ආර්ථික අර්බුදය නිසා මිල උච්ඡාවචන හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතුවල ගැටළු නිසා ස්වේච්ඡා සංවිධාන

බලගැන්වීම්වලදී ආධාර ලබාදීම සීමා විය, එම ඉතිරිවීම් ද යොදවා වෛද්‍යාධාර පොරොත්තු ලේඛනගතව සිටි වැඩි පිරිසකට ආධාර ලබා දීමට හැකි විය.

| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| **683** | 6 | 10.44 * |

* ආධාරක උපකරණ වැඩසටහනින් ඉතිරි වූ රු.මි. 0.72, මුද්‍රණ හා ප්‍රකාශන කටයුතුවලින් ඉතිරි වූ රු.මි. 01.00, වෙනත් හා පරිපාලන වියදම්වල ඉතිරිවීම් රු.මි. 2.48, ස්වෙච්ඡා සංවිධාන බලගැන්වීමෙන් ඉතිරි වූ රු. 0.4 ක මුදලක් ද මෙම වැඩසටහන සඳහා යොදවන ලදී.

### ආධාරක උපකරණ ලබා දීම

ආබාධ සහිත තැනැත්තන් පුනරුත්ථාපනය සඳහා උපකාර වෙමින්, අන්තර්කරණ සංවර්ධනයට දායක කර ගැනීමට හා ඔවුන් ස්වාධීන පුද්ගලයන් බවට පත් කිරීම සඳහා අඩු ආදායම්ලාභී පුද්ගලයින්ට ඇස් කණ්ණාඩි, රෝද පුටු, ඇවිදීමේ රාමු, අත්වාරු, කිහිළිකරු ආදිය උපකරණ වශයෙන් ද වායු මෙට්ට,ජල මෙට්ට ආදී විශේෂ උපකරණ සඳහා උපරිම රු.20,000 දක්වා මුදල් ආධාර ලබාදීම සිදු කෙරේ. ශ්‍රවණ උපකරණ ලබාගැනීම සඳහා රු. 15,000 සිට රු.35,000/- දක්වා මූල්‍ය ආධාර ලබාදීම සිදුකරයි. අඩු ආදායම් ලබන පුද්ගලයන් සඳහා වෛද්‍ය නිර්දේශ මත මෙම ආධාරය ලබා දේ. මෙම වර්ෂයේ ජංගම සේවා 19 ක් පවත්වා උපකරණ පහත පරිදි බෙදා දී ඇත. රටේ පැවති වසංගත තත්ත්වය, තෙල් අර්බුදය හමුවේ ජංගම සේවා පැවැත්වීම සීමා සහිත විය.

| කොමඩ් රෝදපුටු | රෝදපුටු | අත්වාරු | කිහිළිකරු | වෝකර් | ඇස්කණ්නාඩි (ළඟ හා දුර) | ඇස් කණ්නාඩි (කියවීම්) | විශේෂ උපකරණ |
|---|---|---|---|---|---|---|---|
| **01** | 31 | 09 | 05 | 10 | 31 | 13840 | 16 |

### හැකියා වර්ධන වැඩසටහන

ආබාධ සහිත තැනැත්තන්ගේ හා ආබාධ සහිත තැනැත්තන් ඉගෙනුම ලබන විශේෂ අධ්‍යාපන ඒකක සඳහාද ඔවුන්ගේ ක්‍රීඩා, කලා හා සෞන්දර්යාත්මක හැකියාවන් මෙන්ම වෙනත් දක්ෂතා ඔප්නැංවීමේ අරමුණින් රු.50,000 ක උපරිමයක් දක්වා මූල්‍ය අනුග්‍රහය ලබා දීම මෙම වැඩසටහන මඟින් සිදු කෙරේ. රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් මිල ගණන් උච්ඡාවචනය නිසා භාණ්ඩ ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ගැටළු මතුවීම නිසා වර්ෂයේ මුල් කාර්තුවල මෙම වැඩසටහන සඳහා අයදුම්පත් ලැබීම සීමා විය.

| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| **ආයතන 6** | 0.5 | 0.3 |

## ස්වයං රැකියා ආධාර ලබාදීම

අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන්ගේ පවුල්වල පවතින දරිද්‍රතාවය අවම කිරීම සඳහා ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා එක් පුද්ගලයකුට හෝ පවුලකට උපරිම රු.25,000ක් දක්වා ස්වයං රැකියා ආධාර ලබාදීම මෙම වැඩසටහන යටතේ සිදු කෙරේ. එසේම ස්වයං රැකියාව නියාමනය, නිෂ්පාදනවල ගුණාත්මක බව වැඩි කිරීමට මඟපෙන්වීම හා අලෙවිය සඳහා මැදිහත්වීමද මෙහි දී සිදු කෙරේ.

| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| **ප්‍රතිලාභීන් 156** | 4 | 4.06* |

ස්වෙච්ඡා සංවිධාන බලගැන්වීමෙන් ඉතිරි වූ රු. 0.4 ක ඉතිරි ප්‍රතිපාදන ස්වයං රැකියා ආධාර වැඩසටහන යටතේ පොරොත්තු ලේඛනගත අයදුම්කරුවන් වෙත ලබා දෙන ලදී.

## අධ්‍යාපන ආධාර ලබා දීම

අඩු ආදායම්ලබන ආබාධ සහිත දරුවන් හා ආබාධ සහිත භාරකරුවන්ගේ දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීමේ වැඩසටහනකි. මෙම වැඩසටහන යටතේ එක් වරක් පමණක් උපරිමය රු.10,000 වන පරිදි අධ්‍යාපන උපකරණ ලබා ගැනීම සඳහා ආධාර දෙනු ලැබේ.

| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| **ප්‍රතිලාභීන් 421** | 4 | 4.31 * |

## ස්වෙච්ඡා සංවිධාන බලගැන්වීම

මෙම මහ ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි ආයතන 238 ක් පවතින අතර මෙම ආයතන බොහෝමයක් විධිමත් මූල්‍ය ආධාර නොලබන ආයතන වේ. ලැබෙන ඉල්ලීම් අනුව, ක්ෂේත්‍ර පරීක්ෂණ මඟින් තහවුරු කර ගැනීමෙන් පසු එම ආයතනවල භෞතික ඉදිකිරීමක් සඳහා රු.ලක්ෂ දෙකක් දක්වා මූල්‍යාධාර ලබාදීමට මෙම වැඩසටහනින් කටයුතු කෙරේ.

| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| **ආයතන 3** | 1 | 0.6 |

### ජාත්‍යන්තර ආබාධිත දිනය සැමරීම

මෙවර ජාත්‍යන්තර ආබාධිත දින සැමරුම් උළෙල "ප්‍රවේශ විය හැකි සාධාරණ ලෝකයක් පෝෂණය කිරීමේ දී නවෝත්පාදනයේ කාර්යභාරය ඇතුළත් සංවර්ධනය සඳහා පරිවර්තනීය විසඳුම්" යන්න තේමාව කර ගනිමින් අරලිය ගහ මන්දිරයේ දී ජාත්‍යන්තර ආබාධිත දින උත්සවය පවත්වනී ලදී. 2022 පැරා ඔලිම්පික් හා පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවයේ දී විශේෂ දක්ෂතා දැක්වූ 10 දෙනෙකු සඳහා සිහිවටනත් විශ්ව විද්‍යාල ප්‍රවේශයලත් අඩු ආදායම්ලාභී ආබාධ සහිත දූ දැරියන් 10 දෙනෙකුට රු.75,000 බැගින් මුදල් ත්‍යාග ලබා දීම සිදු කර ඇගයීමට ලක් කරන ලදී. මෙම වැඩසටහන සඳහා රු.මි 2.87 ක වියදමක් දරා ඇත.

### නිවාස ආධාර ලබාදීම

කිසිම ආදායම් මාර්ගයක් නොමැති, ඉඩමක් සඳහා හිමිකම් ඇති නමුත් නිවසක් අහිමි ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවසක් තනා දීමේ වැඩසටහන 2001 වසරේ සිට ක්‍රියාත්මක කරන අතර, ජාතික ලොතරැයි මණ්ඩලයේ සුපිරි වාසනා ලොතරැයිය මඟින් ලබන ආදායමින් 5%ක් වාර්ෂිකව මෙම අරමුදල සඳහා වෙන් කිරීමෙන් මූල්‍ය ප්‍රතිපාදන සපයා ගනු ලැබේ.

නව නිවසක් ඉදි කිරීම සඳහා රු.250,000 ක මුදලක් ද අලුත්වැඩියා කර ගැනීමක් සඳහා 150,000 ක මුදලක් වාරික වශයෙන් ලබා දේ.

ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත මෙම වැඩසටහන මන්දගාමී ස්වරූපයක් ගෙන ඇති අතර නිවාස සිහිනය ඇතිව පොරොත්තු ලේඛනවල රැඳී සිටින පිරිස 1650 අධිකය.

| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| **113** | 12 | 9.36 |

### ඉදිරි ඉලක්ක

- 2023 දී ආබාධ සහිත තැනැත්තන් 50 ක් රැකියාගත කිරීම.
- සංඥා භාෂා පනත් කෙටුම්පත අනුමත කර ගැනීම.
- දැනට සංශෝධිත මට්ටමේ පවතින ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ පහසුකම් සැපයීමේ ගැසට් පත්‍රයේ කටයුතු අවසන් කිරීම
- 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සංශෝධන අවසන් කිරීම
- ආබාධ සහිත තැනැත්තන්ට රැකවරණය සපයන ආයතන 03ක් ස්ථාපනය කිරීමට කටයුතු කිරීම
- සංඥා භාෂාව රාජ්‍ය නිලධාරීන් සඳහා අතිරේක විෂයක් ලෙස ස්ථාපිත කිරීම

## III. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය සතු ප්‍රතිපාදන ලැබෙන්නා වූ ආකාර දෙකක් පවතී .එනම්,

- හාණ්ඩාගාර ප්‍රතිපාදන
- වැඩිහිටි සමාජ අරක්ෂණ අරමුදල

### මුළු හාණ්ඩාගාර ප්‍රතිපාදන

| ප්‍රතිපාදන | මුළු වාර්ෂික ප්‍රතිපාදන (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 5 | 2 |
| පුනරාවර්තන | 13,766.09 | 8,082.67 |

### සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන

| ප්‍රතිපාදන | වැඩසටහන | මුළු වාර්ෂික ප්‍රතිපාදන (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|---|---|
| පුනරාවර්තන | වැඩිහිටි ප්‍රතිලාභී වැඩසටහන | 23.16 | 2 |
| | වයස අවුරුදු 70ට වැඩි අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙනුවෙන් රු.2,000/- බැගින් ජොෂ්ඨ පුරවැසි දීමනාව | 13,550.01 | 7,888.93 |
| | අවුරුදු 100 සපිරි ජොෂ්ඨ පුරවැසියන් සඳහා රු.5,000/- බැගින් දීමනාව ගෙවීම | 33.59 | 33.59 |
| | **එකතුව** | **13,606.76** | **7,924.52** |

### හාණ්ඩාගාර ප්‍රතිපාදන යොදා 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

- ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබලගැන්වීම සඳහා අදාළ රෙගුලාසි මුද්‍රණය කිරීම.
- පාසල් සිසුන් සහ විශ්‍රාම පූර්ව පුද්ගලයන් සඳහා දිස්ත්‍රික්ක 4 ක වැඩසටහන් පැවැත්වීම.
- පුද්ගලයන් 183 ක් සඳහා වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම සහ ලැමිනේටින් යන්ත්‍ර 40ක් මිල දී ගැනීම.
- වැඩිහිටි නිවාස නඩත්තු කිරීම, අළුත්වැඩියා කිරීම සහ ප්‍රමිතිගත කිරීම
- වැඩිහිටි තැනැත්තන් 197 ක් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම.
- ජාතික සභා වාර 9 ක් පැවැත්වීම
- ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම

### වැඩිහිටි සමාජ අරක්ෂණ අරමුදල

| මුළු වාර්ෂික ප්‍රතිපාදන (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|
| 763.35 | 533.03 |

- බෝනොවන රෝගවලට ගොදුරු වූ වැඩිහිටි තැනැත්තන් 855 ක් සඳහා එක් අයෙකුට රු. 25,000 බැගින් ලබාදීම
- අඩු අදායම්ලාභී වැඩිහිටි තැනැත්තන් 272 ක් සඳහා ශ්‍රව්‍ය උපකරණ ලබාදීම
- පුද්ගලයන් 145 දෙනෙකු සඳහා වැඩිහිටි තැනැත්තන් රැකබලාගැනීම පිළිබඳ පුහුණුව ලබාදීම
- කතරගම වැඩිහිටි නිවාසය ඉදිකිරීමේ කටයුතු සිදුකිරීම.
- වැඩිහිටි නිවාස 14 ක අළුත් වැඩියා කටයුතු සඳහා රු.මි 1 බැගින් නවීකරණ කටයුතු සඳහා ලබාදීම.
- දිවා මධ්‍යස්ථාන 25 ක් ඉදිකිරීම සඳහා එක් මධ්‍යස්ථානයකට රු.මි.2.5 බැගින් ලබාදීම.
- “දිරිය පියස” නිවාස වැඩසටහන යටතේ විශ්‍රාමගිය අඩුආදායම්ලාභී වැඩිහිටි තැනැත්තන්ගේ නිවාස 50 ඉදිකිරීම සහ අළුත්වැඩියාකටයුතු සඳහා රු.මි.3.5 ක උපරිමයකට යටත්ව මූල්‍යාධාර ලබාදීම.
- “සුව පහසු” මූල්‍යාධාර වැඩසටහන යටතේ තමාට අයිති නිවාස සඳහා අවම පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් අවශ්‍ය වැඩිහිටියන් සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් වැඩිහිටියන් 6 දෙනෙකු සඳහා සහ උපරිමය රු. 50,000 කට යටත්ව වැඩිහිටි තැනැත්තන් 2071 අදාළ සඳහා පහසුකම් ලබාදීම.
- වන්දනාගමන් යාම සඳහා වැඩිහිටි තැනැත්තන් 135 දෙනෙකු සඳහා මූල්‍යාධාර ලබා දීම.
- ග්‍රාමීය වැඩිහිටි කමිටු 663 ක් සඳහා මූල්‍යාධාර ලබාදීම.
- වැඩිහිටි දිවා මුධ්‍යස්ථාන 17 ක් සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම සඳහා මූල්‍යාධාර ලබාදීම.
- හදිසි තත්වයන් ඇති වූ වැඩිහිටි නිවාස 3 ක් සඳහා මූල්‍යාධාර ලබාදීම.
- දිවා මධ්‍යස්ථාවල වැඩිහිටියන් සඳහා තාක්ෂණික සාක්ෂරතාවය ලබාදීමේ වැඩසටහන් සහ අභිප්‍රේරණ යෝග වැඩසටහන් 4 ක් පැවැත්වීම.
- වැඩිහිටි නිවාසවල සිට භාණ්ඩාගාරිකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 27 ක් පැවැත්වීම.

### විශේෂිත ජයග්‍රහණ

i. 2022 වර්ෂයේදී ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ඉදිරි දැක්මක් සහිත උපාය මාර්ගීක සැලැස්මක් සකස් කිරිමට කටයුතු කොට තිබේ.

ii. උපාය මාර්ගීක සැලැස්මට අනුව සංශෝධනය කොට ශ්‍රී ලාංකික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිළිබඳ ජාතික ප්‍රඥප්තිය සහ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම අවසන් අදියරේ පවති.

### ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දෙන අභියෝග

**i.** භාණ්ඩාගාර අරමුදල් මත සිදු කරන වයස අවුරුදු 70ට වැඩි,අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙනුවෙන් මාසික රු.2,000/- බැගින් ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව ගෙවීමේ කටයුතු හා අවුරුදු 100 සපිරි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රු.5,000/-බැගින් සියවස් සපිරි ගෙවීමේ කටයුතු සිදු කිරීමේ දී අධාර ලබා ගැනීමට නොහැකිව විශාල වැඩිහිටි පිරිසක් පොරොත්තු ලේඛනගතව සිටිම.

ii. විශාල පිරිසක් වැඩිහිටි නිවාස වෙත යොමු වීමේ ප්‍රවණතාවයක් ඇති අතර,ඉඩකඩ හා පහසුකම් ප්‍රමාණවත් නොවීම ගැටළුවක් බවට පත් වී තිබේ.

### ඉදිරි ඉලක්ක

i. 2022 වර්ෂයේදී කළුතර, කෑගල්ල, යාපනය යන දිස්ත්‍රික්ක වල වැඩිහිටි නිවාසයන්හි පාලක පාලිකාවන් හට සහ වැඩිහිටි සත්කාරක පුහුණු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කළ අතර, ඉදිරියේ දී සියලු දිස්ත්‍රික්ක වල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, වැඩිහිටියන් වෙනුවෙන් සත්කාර කළ හැකි සත්කාරක සේවක/ සේවිකාවන් 1000 ක් පුහුණු කිරීමට කටයුතු කරනු ඇත.

## IV. ජාතික සමාජ සංවර්ධන ආයතනය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

- බෙල්ජියම් ලිවින් ලින්ග්බර්ග් විශ්ව විද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති අතර, එමගින් සමාජ වැඩ සහ ළමා සංවර්ධනය පිළිබඳ නව පාඨමාලා සඳහා අන්තර් හුවමාරු වැඩ සටහන් දියත් කිරීමටත් නියමිතය.
- ශ්‍රී ලංකාව තුළ සමාජ වැඩ අධ්‍යාපනය සඳහා වෘත්තිය පිළිගැනීමත් ඇති කිරීමට කටයුතු කිරීම සඳහා UNICEF ආයතනයේ අනුග්‍රහය ලැබී ඇත.

### භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක වැඩසටහන්හි ප්‍රගතිය

#### 1. සමාජ සේවා විද්‍යාලය මඟින් ක්‍රියාත්මක පාඨමාලා

සමාජ සේවා විද්‍යාලය යටතේ මෙම පාඨමාලා පැවැත්වූ අතර ඒ අනුව පහත සඳහන් සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලා (MSW) පැවැත්වීම සඳහා රු. මිලි.4.78 ක් වැයකර ඇති අතර මෙම පාඨමාලා සඳහා සිසුන් 150 ක් සහභාගී වී ඇත. (මුදල් අයකරනු ලැබේ)

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී(BSW) පාඨමාලා හා උසස් ඩිප්ලෝමා පාඨමාලා සඳහා සිසුන් 800 ක් සහභාගී වී ඇති අතර ඒ සඳහා රු. මි. 4.1 ක් වැයවී ඇත.

#### 2. පුහුණු අංශය මඟින් සමාජීය අවශ්‍යතා මත පවත්වන ලද පුහුණු වැඩසටහන්

මෙම අංශය මඟින් පවත්වන ලද පාඨමාලා කොළඹ ප්‍රධාන මධ්‍යස්ථානයේ හා රත්න, තලාව, අම්පාර, කිලිනොච්චිය, ත්‍රිකුණාමලය, මාතර, කුරුණෑගල, මඩකලපුව, රත්නපුරය, නුවර යන නගර කේන්ද්‍ර කරගනිමින් පාඨමාලා 14 පවත්වා ඇත. ඒ සඳහා රු.71,868.00 ක වියදමක් දරා ඇත.

#### ➢ ඩිප්ලෝමා පාඨමාලා (මුදල් අය කරන)

මෙම අංශය මඟින් 2019 සිට 2022 දක්වා පවත්වන ලද ඩිප්ලෝමා පාඨමාලා යාපනය, කිලිනොච්චිය, අම්පාර, ත්‍රිකුණාමලය, නුවර, හැටන්, මඩකලපුව, වව්නියාව යන දිස්ත්‍රික්ක වල දෙමළ භාෂාවෙන් ද කුරුණෑගල, රත්නපුර, තලාව, සීදුව, රත්න හා අම්පාර යන දිස්ත්‍රික්ක වල සිංහල භාෂාවෙන් ද සීදුව

දිස්ත්‍රික්කයේ පමණක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා 3 න්ම පවත්වන ලද පාඨමලා සඳහා රු.මි.18.83 ක වියදමක් දරා ඇත.

### 3. සමාජ සංවර්ධන ප්‍රතිපත්ති හා ප්‍රකාශන අංශය මඟින් සිදුකරන ලද පර්යේෂණ, සමීක්ෂණ හා නිකුත් කරන ලද ප්‍රකාශන

i. අධ්‍යයන කටයුතු මණ්ඩලයේ අනුමැතිය යටතේ සමාජ වැඩ ජර්නලය වාර්ෂිකව සඟරා 2 ක් මේ වන විට නිකුත් කර ඇත. මුළු වියදම රු.මි.0.03 කි.

ii. සමාජ සංවර්ධන ජර්නල දෙකක් වාර්ෂිකව ප්‍රසිද්ධ කර ඇත. මුළු වියදම රු. 0.03 කි

iii. අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ පලකිරිමට කටයුතු කර ඇති සඟරා දෙක දැනට වාර්ෂිකව ප්‍රසිද්ධියට පත් කර ඇත. මුළු වියදම රු.මි 0.03කි.

iv. පුවත් හසුන මුද්‍රණය කර අවසන් කර ඇති අතර අන්තර්ජාලය ඔස්සේ ප්‍රසිද්ධියට පත් කර ඇත. මුළු වියදම රු.මි. 0.03 කි.

v. කොවිඩ් 19 වෛරසය වැළඳුනු ප්‍රජාව සුවපත්භාවයට පත් වූ පසු සමාජ අන්තර් සම්බන්ධතා පැවැත්වීමේදී මුහුණ දෙන මනෝ සමාජීය ගැටලු පිළිබඳ අධ්‍යයනය - අධ්‍යයන වාර්තාව අවසන් කර ඇත. මුළු වියදම රු.මි. 0.05 කි.

vi. කොවිඩ් 19 කාලය තුලදී සෞඛ්‍ය ආරක්ෂණය සහ අපද්‍රව්‍ය කළමණාකරණය සම්බන්ධයෙන් ඇති පාරිසරික බලපෑම වාර්තාව සකස් කර ඇත. - මුළු වියදම 0.05 කි.

vii. ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා සීදුව ප්‍රදේශයේ ඉදිකරනු ලබන ගොඩනැගිලි සංකීර්ණයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය

මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම 2017.01.01 දින ආරම්භ කරන ලද අතර 2022 ඔක්තෝබර් අවසන් කිරීමට නියමිතය. මෙම ගොඩනැගිල්ල A හා B ලෙස කොටස් දෙකකින් සමන්විතය.

| ඇස්තමේන්තු ගත මුළු වියදම (රු. මි.) | 2017.01.01 සිට 2021.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | 2022 වර්ෂය සඳහා අනුමත අයවැය (රු.මි.) | 2022.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | 2017.01.01 සිට 2022.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | 2022.09.30 දක්වා භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| **1,000.00** | 750.45 | 60.00 | 48.30 | 798.75 | A කොටස - (97.1%) |
| | | | | | B කොටස - (100%) |

## VII. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

### 2022.01.01 සිට 2022.12.31 දක්වා බඳවාගැනීම් හා ප්‍රතිලාභ ගෙවීම් ප්‍රගතිය

#### සාමාජිකයන් බඳවාගැනීම

| 1996.01.01 සිට 2021.12.31 දක්වා එකතුව | | 2022.01.01 සිට 2022.12.31 දක්වා එකතුව | | 2022.12.31 දක්වා මුළු එකතුව | |
|---|---|---|---|---|---|
| සාමාජිකයින් සංඛ්‍යාව | මුල් වාරික මුදල (රු. මිලියන) | සාමාජිකයින් සංඛ්‍යාව | මුල් වාරික මුදල (රු. මිලියන) | සාමාජිකයින් සංඛ්‍යාව | මුල් වාරික මුදල (රු. මිලියන) |
| 834,796 | 638.84 | 56,764 | 114.60 | 891,560 | 753.44 |

#### ප්‍රතිලාභ ගෙවීම්

**I. විශ්‍රාම වැටුප් ගෙවීම**

| 1996.01.01 සිට 2021.12.31 දක්වා එකතුව | | 2022.01.01 සිට 2022.12.31 දක්වා එකතුව | | 2022.12.31 දක්වා මුළු එකතුව | |
|---|---|---|---|---|---|
| සාමාජිකයින් සංඛ්‍යාව | වටිනාකම (රු. මිලියන) | සාමාජිකයින් සංඛ්‍යාව | වටිනාකම (රු. මිලියන) | සාමාජිකයින් සංඛ්‍යාව | වටිනාකම (රු. මිලියන) |
| 32,976 | 2,622.65 | 34,132 | 379.91 | 34,132 | 3,002.56 |

**II. පාරිතෝෂික හා අතිරේක ප්‍රතිලාභ ගෙවීම**

| විස්තරය | 1996.01.01 සිට 2021.12.31 දක්වා එකතුව | | 2022.01.01 සිට 2022.12.31 දක්වා එකතුව | | 2022.12.31 දක්වා මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | වටිනාකම (රු. මිලියන) | සංඛ්‍යාව | වටිනාකම (රු. මිලියන) | සංඛ්‍යාව | වටිනාකම (රු. මිලියන) |
| මරණ පාරිතෝෂික | 2,293 | 41.01 | 40 | 1.48 | 2,333 | 42.49 |
| පූර්ණ අබලතා පාරිතෝෂික | 35 | 1.07 | - | | 35 | 1.07 |
| අර්ධ අබලතා පාරිතෝෂික | 75 | 1.18 | - | | 75 | 1.18 |
| පූර්ණ අබලතා මාසික දීමනා | 27 | 8.16 | 27 | 0.53 | 27 | 8.69 |
| "ආරස්සාව" පූර්ව සැලසුම් යෝජනා ක්‍රමයේ අතිරේක ප්‍රතිලාභ ගෙවීම | 1,590 | 43.36 | 418 | 4.91 | 2,008 | 48.27 |

## විශේෂ ජයග්‍රහණ

- 2022 වර්ෂය තුළදී නව සාමාජිකයින් 56,74 ක් බඳවාගැනීම සහ 34,132 වෙත මාසිකව විශ්‍රාම වැටුප් ප්‍රදානය. මීට අතිරේකව සාමාජිකයින් රැසක් සඳහා අබලතා පාරිතෝෂික, මරණ පාරිතෝෂික, අධ්‍යාපන කඩයිම් ප්‍රතිලාභ ඇතුළු අනෙකුත් ප්‍රතිලාභ වර්ෂය තුළ දී ප්‍රදානය කරන ලදී.
- වෙළඳ නාවික ලේකම් කාර්යාලය හා ඒකාබද්ධව නාවිකයන් වෙනුවෙන් හඳුන්වාදුන් "නාවිකයා" සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා වූ නෛතික ප්‍රතිපාදන ඇතුළත් කරමින් ගැසට් පත්‍රයක් ප්‍රකාශයට පත් කිරීම.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා එක්ව විගමණික ශ්‍රමිකයින් සඳහා වූ "මනුසවි" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ජනගත කිරීම සහ ඊට අදාළව අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම.
- භික්ෂූන් වහන්සේලාගේ දෙමාපියන් සඳහා "බුදු පුත් මාපිය හරසර" නමින් විශ්‍රාම වැටුප් යොජනා ක්‍රමයක් එළිදැක්වීම සහ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහයෝගී දායකත්වය ලබාගැනීම සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව සමග අවබෝධතා ගිවිසුමකට එළඹීම.
- "සෞභාග්‍යා" කාර්යාංශය හා ඒකාබද්ධව "සෞභාග්‍යා" නිෂ්පාදන ගම්මාන යටතේ සවිබලගැන් වූ ව්‍යවසායකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හඳුන්වාදීම ආරම්භ කිරීම.
- වැවිලි කර්මාන්තය ආශ්‍රිත සේවා නියුක්තිකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම.

## අභියෝග හා ඉදිරි ඉලක්ක

- විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා 2023 වර්ෂයේ දී නව සාමාජිකයින් 42,500ක් (සියළු ව්‍යාපෘති මගින් සිදුකරනු ලබන බඳවාගැනීම් ද සහිතව) බඳවා ගැනීම.
- ව්‍යවසායකයින් සඳහාම වූ නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම සහ ඒ තුළින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් බිහි කිරීම, ආරක්ෂා කිරීම සහ දිරිගැන්වීම.
- වෙළඳ නාවිකයන් "නාවිකයා" සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයට ඇතුළත් කර ගැනීම.
- "බුදු පුත් මාපිය හරසර" වැඩසටහන යටතේ භික්ෂූන් වහන්සේලාගේ දෙමාපියන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ඇතුළත් කර ගැනීම.
- සවිබලගැන් වූ සමෘද්ධි ප්‍රතිලාභීන් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ඇතුළත් කර ගැනීම.
- "සෞභාග්‍යා" කාර්යාංශය හා ඒකාබද්ධව "සෞභාග්‍යා" නිෂ්පාදන ගම්මාන යටතේ සවිබලගැන් වූ ව්‍යවසායකයින් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා සඳහා සාමාජික කරගැනීම.
- වැවිලි මානව සම්පත් භාරය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම සහ එමගින් වැවිලි කර්මාන්තය ආශ්‍රිත සේවා නියුක්තිකයින් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයට ඇතුළත් කර ගැනීම විධිමත් කිරීම.

- මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග අවබෝධතා ගිවිසුමකට එළඹීම සහ එමගින් පතල් කම්කරුවන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට සාමාජික කරගැනීම.
- පාසල් ශිෂ්‍ය ප්‍රජාව තුළ සමාජ ආරක්ෂණය පිළිබඳ දැනුම හා අවශ්‍යතාව ප්‍රචලිත කිරීමට හඳුන්වාදුන් වැඩසටහන දීප ව්‍යාප්ත වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- ස්වයං රැකියා සඳහා යොමුවීමට තරුණ තරුණියන් දිරිමත් කිරීම සහ ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කරගැනීමට සහය ලබාදීමට වෘත්තීය පුහුණු ආයතන හා ඒකාබද්ධව අභිප්‍රේරණ වැඩසටහන් මාලාවක් පැවැත්වීම.
- සමාජ ආරක්ෂණ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කිරීම.
- "කලාකරු" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා කලාකරුවන් බඳවාගැනීම.
- සමාජ ආරක්ෂණය සම්බන්ධ දැනුම ප්‍රචලිත කිරීම සඳහා සමාජ ආරක්ෂණය පිළිබඳව පාසල් විෂයට ඇතුළත් කිරීම.

## V. ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

### 2022.12.31 දක්වා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

ආයතනය සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන රු.මි. 40.1 ක් වන අතර 2022.12.31 දිනට මුළු වියදම රු.මි. 40.1 කි. එම මුළු ප්‍රතිපාදනවලින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 0.74 වෙන්කර ඇති අතර එයින් 2022 වර්ෂය අවසන් වන විට රු.මි. 0.12 ක සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කොට ඇත.

සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදනවලින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් පහත පරිදි වේ.

| ක්‍රියාකාරකම් | වාර්ෂික ප්‍රතිපාදන (රු.මි) | මූල්‍ය හා භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | භෞතික ප්‍රගතිය |
| තෝරාගත් සෞභාග්‍යා ගම්මානවල සහභාගීත්ව ග්‍රාමීය ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම | 0.050 | 0.046 | වැඩසටහන් 02 ( නිලධාරීන් 63) |
| වර්තමානයේ පවතින උද්දමන තත්වය හමුවේ අඩු ආදායම් ලාභීන්ගේ ජීවන තත්වය පිළිබඳ සමීක්ෂණයක් සිදුකිරීම | - | - | සමීක්ෂණ වාර්තාව සම්පූර්ණ කර ඇත. |
| ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා භාවිතා කරන උපාය මාර්ග පිළිබඳ විමර්ශන අධ්‍යයනය | - | - | වාර්තා 6ක් සම්පූර්ණ කර ඇත. |

| | | | |
|---|---|---|---|
| වර්තමාන ආර්ථික තත්වය සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා සිදුකරනු ලබන බලපෑම පිළිබඳ සිද්ධි අධ්‍යයනයක් සිදු කිරීම | - | - | සිද්ධි අධ්‍යයන වාර්තාව සම්පූර්ණ කර ඇත. |
| ක්ෂේත්‍ර නිලධාරින් සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | - | - | වැඩසටහන් 29 |
| බාහිර ආයතන සමඟ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම | - | - | වැඩසටහන් 01 |
| දරිද්‍රතා දිනයට සමගාමීව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 0.240 | 0.070 | ප්‍රජාශක්ති විශේෂ වෙළුම නිකුත්කිරීම,මාර්ගගත දේශන 03 |
| පුහුණුව සහ නවාතැන් සඳහා බාහිර ආයතන සඳහා පහසුකම් සැලසීම | - | - | සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ට නවාතැන් ලබාදීම |
| ප්‍රජාශක්ති සඟරාවේ විද්‍යුත් වෙළුම් නිකුත් කිරීම | - | - | වෙළුම් 2 ක් ප්‍රකාශයට පත් කිරීම |
| වෙබ් ප්‍රකාශන සංවර්ධන පුවත් | - | - | 1 වෙළුමක් ප්‍රකාශයට පත් කිරීම |
| පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම | - | - | ප්‍රකාශන 2,000ක් සඳහා වර්ණ කේත පද්ධතිය යොදා ගැනීම |
| ආයතනික පහසුකම් පිළිබඳ ප්‍රචාරක වැඩසටහනක් හඳුන්වා දීම | 0.020 | - | 02 නාම පුවරු සවි කිරීම, U tube නාලිකාවක් ආරම්භ කිරීම |
| මාසික ප්‍රගති සමාලෝචන පැවැත්වීම | 0.085 | 0.027 | රැස්වීම 15 |
| වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම | 0.145 | - | ගෙවීම් සඳහා වවුචරය ඉදිරිපත් කර ඇත |
| යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීම | 0.200 | - | පවතින තත්ත්වය මත භාණ්ඩ මිලදී ගැනීමට නොහැකි විය. |
| **එකතුව** | **0.74** | **0.14** | |

## VI. උපදේශන අංශය

### විශේෂ ජයග්‍රහණ හා ප්‍රගතිය

| මුළු වාර්ෂික ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|
| 10 | 4.12 |

i. මානසික ව්‍යාකූලත්වයට ගොදුරු වීමෙන් ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා මනෝවිද්‍යාත්මක උපදේශන මැදිහත්වීම් වැඩසටහන් 191 ක් ක්‍රියාත්මක කිරීම.

ii. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානවල ප්‍රතිලාභීන් සඳහා උපදේශන සායන ලෙස මනෝවිද්‍යාත්මක උපදේශන මැදිහත්වීම් වැඩසටහන් 133 පැවැත්වීම.

iii. නව මෘදුකාංග සහ උපකරණ භාවිතා කරමින් මනෝවිද්‍යාත්මක උපදේශන සේවාව සම්බන්ධීකරණය කිරීම, ප්‍රවර්ධනය සහ ප්‍රකාශනය කිරිම සඳහා අන්තර්ජාල පහසුකම් සැපයීම.

iv. ජාතික හා දිස්ත්‍රික් මට්ටමේ උපදේශන කටයුතු සම්බන්ධීකරණය රැස්වීම් 12 ක් පැවැත්වීම.

v. මාර්ගගත දත්ත ගබඩාවක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම. (SSL Certificate)

vi. පැය 24 පුරා ජංගම උපදේශන සේවාව සඳහා නිසි ක්‍රමවේදයකට ප්‍රතිසංස්කරණය කිරීම. (ඇමතුම් 3,667)

vii. නිලධාරීන් 16 දෙනෙකු සඳහා කාර්යාල උපකරණ ලබා දිම.

viii. ජාතික උපදේශන දින සැමරුම 230 කගේ සහභාගිත්වයෙන් පැවැත්වීම.

### ඉදිරි ඉලක්ක

i. ප්‍රජාව සවිබලගැන්වීම තුලින් ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ඇති කිරීම.

ii. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ප්‍රජාව ආර්ථිකව සවිබලගැන්වීම සඳහා මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන් සහ අභිප්‍රේරණ වැඩසටහන් පැවැත්වීම.

iii. සංවර්ධනාත්මක හා නිවාරණාත්මක උපදේශන වැඩසටහන් පැවැත්වීමෙන් මනෝ සමාජයීය ගැටලු අවම කිරීම.

iv. ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන උපදේශන වැඩසටහන් සඳහා ප්‍රජා සහභාගිත්වය ඉහළ නැංවීම.

v. උපදේශන සේවාවේ නිරත උපදේශකයින් සහ ආයතන පිළිගත් විධිමත් නියාමන ක්‍රමවේදයක් මඟින් උපදේශන සේවාව සම්බන්ධයෙන් ප්‍රජාව තුළ විශ්වසනීයත්වය ගොඩනැඟීම.

vi. උපදේශන සේවාව අවශ්‍ය, නමුත් ඒ සඳහා සෘජුව යොමුවීමට අකමැති හෝ නොහැකි සේවාලාභීන්ට දුරකථන පහසුකම් ඔස්සේ උපදේශන සේවාව ලබා දීමේ ක්‍රමවේදය සංවර්ධනය කිරීම.

vii. උපදේශන සේවාව සම්බන්ධයෙන් සමාජගත වී ඇති විවිධ මතවාද නිවැරදි කිරීම හා පැහැදිලි අවබෝධයක් සමාජගත කිරීම.

viii. මානසික රෝග හා මානසික සෞඛ්‍ය ක්ෂේත්‍ර පිළිබඳ සමාජයේ පවතින අවමාන සහගත ලේබල් කිරීම් දුරු කර උපදේශන සේවා සඳහා යොමුවීමට පහසුකම් සැලසීම

ix. උපදේශන සේවාව පිළිබඳ පවතින නව ප්‍රවණතා හා ක්‍රම ශිල්ප පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා අවස්ථා වැඩි දියුණු කිරීම.

### ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දෙන අභියෝග

i. ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ආකල්ප සංවර්ධන වැඩසටහන්, මූලාා සාක්ෂරතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, ජීවන ඉලක්ක ගොඩනැංවීම වැනි උපදේශන වැඩසටහන් සඳහා තරුණයන්ගේ සහභාගිත්වය ඉතා අඩු අගයක් පෙන්වීම තුළින් රටේ සංවර්ධනයට තරුණයන්ගේ දායකත්වය නිසි පරිදි නොලැබීම.

ii. පවුල් සබඳතා හා දරුවන්ගේ ගැටලුවලදී සැමියා හා බිරිඳ යන දෙදෙනාගේ ම දායකත්වය අත්‍යාවශ්‍ය වුවද සැමියාගේ දායකත්වය ලබාගැනීම අපහසු නිසා මැදිහත්කරණය සාර්ථක නොවීම.

iii. උපදේශන සේවාව හරහා ක්ෂණික විසඳුම් ලබාගත නොහැකි අතර ඒ සඳහා සැසි කිහිපයකට පැමිණීමට සිදුවන නිසාත් ආර්ථික දුෂ්කරතා නිසාත් සේවාලාභීන් උපදේශන සැසි කිහිපයකට පැමිණීමට එකඟතාව නොදැක්වීම.

iv. මානසික රෝග හා මානසික සෞඛ්‍ය ක්ෂේත්‍ර පිළිබඳ සමාජයේ පවතින අවමාන සහගත ලේබල් කිරීම නිසා උපදේශන සේවාව ලබා ගැනීමට යොමු වීමට අකමැති වීම.

v. උපදේශන සේවාවක් සැපයීමට සුදුසු පරිසරයක/ වාතාරණයක් සහිත සහ අවම මට්ටමින් හෝ ප්‍රමාණවත් පහසුකම් ඇති උපදේශන මධ්‍යස්ථාන හෝ උපදේශන කාමර බොහෝ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නොමැති වීම.

vi. වර්තමානයේ මාධ්‍ය ක්ෂේත්‍රයේ විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් උපදේශන සේවාව හා වෘත්තීය පිළිබඳ නිවැරදි මෙන්ම පැහැදිලි අවබෝධයක් සමාජගත කිරීමට නොහැකිවීම.

vii. උපදේශන සේවාව පිළිබඳ පවතින නව ප්‍රවණතා හා ක්‍රම ශිල්ප පිළිබඳ අධ්‍යයනය කිරිම සඳහා පවතින අවස්ථා සීමාසහිත වීම.

viii. උපදේශන ක්ෂේත්‍රය පිළිබඳ විශේෂ ප්‍රාගුණ්‍යයක් සහිත විද්වතුන් සම්පත්දායකයන් ලෙස රාජ්‍ය ආයතනයන්හි කුසලතා සංවර්ධන වැඩසටහන්වලට ඔවුන්ගේ දායකත්වය ලබාගත නොහැකි වීම.

ix. උපදේශන ක්ෂේත්‍රය සම්බන්ධ ජාත්‍යන්තර පුහුණු වැඩසටහ්නවලට සහභාගී වීමට තිබෙන අවස්ථාවන් සීමාසහිත වීම.

x. වර්තමානයේ ප්‍රජාව මුහුණ දෙන සමාජ ආර්ථික වටපිටාව හේතුවෙන් ඔවුන් තුළ අභිප්‍රේරණය පහළ බැසීම නිසා සමස්ත උපදේශන වැඩසටහන් සඳහා මද වශයෙන් යොමුවීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වීම.

xi. කෝවිඩ් අභියෝගය නිසා පවතින සමාජ දුරස්ථකරණය හේතුවෙන් ප්‍රජාව වැඩසටහන් සඳහා සම්බන්ධවීම සහ උපදේශනය සඳහා යොමුවීම අවම වීම.

xii. වර්තමානයේ පවතින ආර්ථික අවපාතය හමුවේ එදිනෙදා ජීවිතය පවත්වාගෙන යාමේ අභියෝගය හේතුවෙන් ග්‍රාමීය ප්‍රජාව ආර්ථිකමය වශයෙන් වාසිදායක වන වැඩසටහන්වලට පමණක් යොමුවීම නිසා උපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී කරවා ගැනීමට අමතර ශ්‍රමයක් දැරීමට සිදුවීම සහ වෙනත් උපක්‍රම භාවිතා කිරීමට සිදුවීම.

## VII. පාලන අංශය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

2022 වර්ෂය ආරම්භයේ දී අමාත්‍යාංශයේ සමාජ සවිබලගැන්වීම් අංශයට හා අනුබද්ධ ආයතවලට බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් හා උපාධිධාරි අභ්‍යාසලාභීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වර්ෂය තුළ පහත දැක්වෙන පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- නිලධාරීන් 347 සඳහා කුසලතා හා දැනුම වර්ධන පුහුණු වැඩසටහන් 3 ,ආකල්ප හා දැනුම වර්ධන පුහුණු වැඩසටහන් 2 (පළමු කාර්තුව තුළ)

නමුත් රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව දෙවන හා තුන්වන කාර්තු තුළ පුහුණු වැඩසටහන් පැවැත්වීම අත්හිටුවන ලදී.

එනමුත් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අනුමැතිය මත නැවත හතරවන කාර්තුවේදී පහත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- කොළඹ, කැළණිය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාල මඟින් ආරම්භ කරන ලද පශ්චාද් උපාධි පාඨමාලා හතරකට මාණ්ඩලික නිලධාරීන් 4 දෙනෙකු සඳහා පාඨමාලා ගාස්තු ලබා දීම.
- ද්විතියික ශ්‍රේණියේ නිලධාරීන් 83 දෙනෙක් සඳහා පැය 150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාවක් පැවැත්වීම.
- කුසලතා හා දැනුම වර්ධන පුහුණු වැඩසටහනක් හා ආකල්ප හා දැනුම වර්ධන පුහුණු වැඩසටහන් දෙකක් නිලධාරීන් 205 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවැත්වීම.

### අභියෝග හා ඉදිරි ඉලක්ක

1. අංක 02/2018 හා 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව 2021 හා 2022 වර්ෂ සඳහා සකස් කර ඇති මානව සම්පත් සංවර්ධන සැලැස්මේ ඇතුළත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම
2. රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා නිකුත් කරන ලද 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හේතුවෙන් දෙවන හා තුන්වන කාර්තු තුළ දී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලද බැවින් අවසන් කාර්තුව තුළ ඉතිරි වූ ප්‍රතිපාදන යොදා ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඉතිරි වූ කාලය ප්‍රමාණවත් නොවීම.

## VIII. සැලසුම් හා මෙහෙයුම් අංශය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

i. අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය සඳහා අවශ්‍ය මූලික දත්ත හා තොරතුරු රැස් කිරීම.

ii. 2022 වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා අවශ්‍යතාවය අනුව එම ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීම.

iii. 2021 වර්ෂයට අදාලව අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.

iv. 2022 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කිරීම.

v. 2022 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය සමාලෝචනය සඳහා කාර්තුමය වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

vi. අමාත්‍යාංශයේ විෂය පථයට අදාල විවිධ පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණය පවත්වා ගනිමින් අවශ්‍යතාවය අනුව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

vii. ලෝක බැංකු ව්‍යාපෘතිවල අවිනිශ්චිත හදිසි ප්‍රතිකාර සංරචක යටතේ ක්‍රියාත්මක වන සමෘද්ධි දීමනාව, ආබාධ සහිත පුද්ගල ජීවනාධාරය, නිදන්ගත වකුගඩු රෝගී ජීවනාධාරය, වයස අවුරුදු 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව, සියවස් සපිරි ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව ඇතුලත් මුදල් හුවමාරු වැඩසටහන සම්බන්ධිකරණය කිරිම.

viii. ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ අමාත්‍යාංශයේ ඇති දෙපාර්තමේන්තු/ ආයතන මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්බන්ධිකරණය.

## IX. විදේශ ආධාර ව්‍යාපෘති

### A. ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක හදිසි මූල්‍යාධාර වැඩසටහන 2022 (මැයි- ඔක්තෝබර්)

| | වර්ගය | හඳුනාගත් පවුල් සංඛ්‍යාව | ප්‍රතිපාදන නිදහස්කළ පවුල් සංඛ්‍යාව | නිදහස් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) |
|---|---|---|---|---|
| සමෘද්ධි දීමනාව ගෙවීම | | | | |
| 1 | නිත්‍ය ප්‍රතිලාභීන් සඳහා දීමනාව ගෙවීම | 1,689,461 | 1,689,461 | 10,778.30 |
| 2 | නිත්‍ය ප්‍රතිලාභීන් සඳහා අමතර දීමනාව ගෙවීම | 1,689,461 | 1,689,461 | 15,544.30 |
| 3 | පොරොත්තු ලේඛනයේ සිටින ප්‍රතිලාභීන් සඳහා දීමනාව ගෙවීම | 731,975 | 726,449 | 10,896.73 |
| | **උප එකතුව** | **2,421,436** | **2,415,910** | **37,219.33** |
| වැඩිහිටි තැනැත්තන් සඳහා මාසික දීමනාව ගෙවීම | | | | |
| 4 | පොරොත්තු ලේඛනයේ ප්‍රතිලාභීන් සඳහා දීමනාව ගෙවීම | 131,152 | 131,152 | 1,974.02 |
| ආබාධ සහිත තැනැත්තන් සඳහා දීමනාව ගෙවීම | | | | |
| 5 | පොරොත්තු ලේඛනයේ ප්‍රතිලාභීන් සඳහා දීමනාව ගෙවීම | 25,072 | 25,072 | 377.36 |
| වකුගඩු රෝගීන් සඳහා මාසික දීමනාව ගෙවීම | | | | |
| 6 | පොරොත්තු ලේඛනයේ ප්‍රතිලාභීන් සඳහා දීමනාව ගෙවීම | 3,232 | 3,232 | 48.60 |
| | **උප එකතුව** | **159,456** | **159,456** | **2,399.98** |
| **මුළු එකතුව** | | **2,580,892** | **2,575,366** | **39,619.31** |

**B.** ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය - 2022 (සැප්තැම්බර්, ඔක්තෝබර්,නොවැම්බර්)

| ප්‍රතිලාභී වර්ගය | | ඇස්තමේන්තුගත පවුල් සංඛ්‍යාව | සැප්තැම්බර් | | ඔක්තෝබර් | | නොවැම්බර් | | සමෘද්ධි බැංකු වෙත නිදහස් කරන ලද මුදල් ප්‍රමාණය (රු.මි.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | පවුල් සංඛ්‍යාව | බැංකු වෙත නිදහස් කරන ලද මුදල් ප්‍රමාණය (රු.මි) | පවුල් සංඛ්‍යාව | බැංකු වෙත නිදහස් කරන ලද මුදල් ප්‍රමාණය (රු.මි) | පවුල් සංඛ්‍යාව | බැංකු වෙත නිදහස් කරන ලද මුදල් ප්‍රමාණය (රු.මි) | |
| **1.** සමෘද්ධි ප්‍රතිලාභීන් | | | | | | | | | |
| **1.1** | නිත්‍ය ගෙවීම් | 1,702,603 | - | - | 1,676,717 | 5,326.03 | 1,670,878 | 5,299.90 | 10,625.93 |
| **1.2** | අමතර ගෙවීම් | 1,702,603 | 1,682,009 | 5,148.24 | 1,676,717 | 5,132.33 | 1,670,878 | 5,114.72 | 15,395.29 |
| **1.3** | පොරොත්තු ලේඛනයේ ගෙවීම් | 731,975 | 731,975 | 3,659.87 | 731,975 | 3,659.88 | 731,975 | 3,668.89 | 10,988.64 |
| | උප එකතුව | **2,434,578** | **2,413,984** | **8,808.11** | **2,408,692** | **14,118.24** | **2,402,853** | **14,083.51** | **37,009.86** |
| **2.** වැඩිහිටි දීමනාව ලබන ප්‍රතිලාභීන් | | | | | | | | | |
| **2.1** | වයස අවුරුදු **100** වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් | | | | | | | | |
| **2.1.1** | නිත්‍ය ගෙවීම් | 520 | 520 | 2.61 | 478 | 2.39 | 536 | 2.68 | 7.68 |
| **2.1.2** | අමතර ගෙවීම් | 289 | 165 | 0.41 | 165 | 0.66 | 165 | 0.66 | 1.73 |
| **2.2** | වයස අවුරුදු **70** ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් | | | | | | | | |
| **2.2.1** | නිත්‍ය ගෙවීම් | 416,833 | 415,398 | 824.06 | 416,833 | 834.85 | 378,644 | 757.29 | 2,416.20 |
| **2.2.2** | අමතර ගෙවීම් | 248,126 | 243,933 | 731.79 | 235,968 | 707.90 | 204,342 | 613.03 | 2,052.72 |
| **2.2.3** | පොරොත්තු ලේඛනයේ ගෙවීම් | 132,500 | 114,857 | 575.18 | 115,018 | 575.09 | 95,778 | 478.89 | 1,629.16 |
| | උප එකතුව | **549,853** | **530,775** | **2,134.05** | **532,329** | **2,120.89** | **474,958** | **1,852.55** | **6,107.49** |
| **3.** ආබාධිත දීමනාව ලබන ප්‍රතිලාභීන් | | | | | | | | | |
| **3.1** | නිත්‍ය ගෙවීම් | 72,000 | 70,278 | 351.39 | 73,164 | 369.08 | 72,513 | 362.57 | 1,083.04 |
| **3.2** | අමතර ගෙවීම් | 23,837 | 20,987 | 52.46 | 20,982 | 52.45 | 21,035 | 52.59 | 157.50 |
| **3.3** | පොරොත්තු ලේඛනයේ ගෙවීම් | 25,327 | 21,767 | 108.83 | 22,161 | 110.80 | 22,249 | 111.25 | 330.88 |
| | උප එකතුව | **97,327** | **92,045** | **512.68** | **95,325** | **532.33** | **94,762** | **526.41** | **1,571.42** |
| **4.** වකුගඩු දීමනාව ලබන ප්‍රතිලාභීන් | | | | | | | | | |
| **4.1** | නිත්‍ය ගෙවීම් | 43,185 | 43,185 | 215.93 | 40,555 | 199.51 | 39,251 | 196.25 | 611.69 |
| **4.2** | අමතර ගෙවීම් | 21,003 | 19,288 | 48.22 | 19,158 | 47.90 | 18,995 | 48.49 | 144.61 |
| **4.3** | පොරොත්තු ලේඛනයේ ගෙවීම් | 4,248 | 4,248 | 21.24 | 4,353 | 21.77 | 3,265 | 16.33 | 59.34 |
| | උප එකතුව | **47,433** | **47,433** | **285.39** | **44,908** | **269.18** | **42,516** | **261.07** | **815.64** |
| මුළු එකතුව | | **3,129,191** | **3,084,237** | **11,740.23** | **3,081,254** | **17,040.64** | **3,015,089** | **16,723.54** | **45,504.41** |

මූලාශ්‍රය: මූල්‍ය අංශය - ස.සං.දෙ

# පරිච්ඡේදය 03

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒ සී ඒ - එෆ්

**2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

| අයවැය 2022 | | සටහන | තත්‍ය | | |
|---|---|---|---|---|---|
| | | | වර්තමාන වර්ෂය | නැවත ගලපන ලද | |
| | | | 2022 | 2021 | |
| - | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,814,521,001 | - | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 27,157,529 | - | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 202,172,895 | - | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **2,043,851,425** | - | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **2,043,851,425** | - | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 11,560,292 | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ =(ඇ)-(ඈ)** | | 2,032,291,133 | - | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 1,170,620,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 1,143,556,592 | - | ඒසීඒ 2(ii) |
| 868,178,400 | අනෙකුත්භාණ්ඩ හා සේවා | 6 | 835,124,775 | - | |
| 26,022,971,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 12,705,436,785 | - | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **28,061,769,400** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **14,684,118,152** | - | |
| | **මූලධන වියදම්** | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12,360,600 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | **10** | 10,020,708 | - | |
| 81,750,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 80,243,535 | - | |
| 97,176,000 | ප්‍රාග්ධන මාරු කිරීම් | **12** | 85,204,725 | - | **ඒසීඒ-2(ii)** |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 1,900,000 | හැකියා වර්ධනය | **14** | 1,272,519 | - | |
| 4,383,730,000 | වෙනත් මූලධන වියදම් | **15** | 3,784,955,608 | - | |
| 4,576,916,600 | **මුළු මූලධන වියදම් (උ)** | | **3,961,697,095** | - | |
| | තැන්පතු ගෙවීම් | | 15,938,013 | - | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 359,021,480 | - | **ඒසීඒ-5/5** |
| | **වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්** | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **374,959,493** | - | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | **19,020,774,740** | - | |
| - | **2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ-එ)** | | **(16,988,483,607)** | - | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | **(16,988,483,607)** | | **ඒසීඒ-7**<br>**ඒසීඒ-3** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | **-** | | |
| | | | **(16,988,483,607)** | **-** | |

## 3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-ප

2022 දෙසැම්බර් 31 දිනට
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | සත්‍ය 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,656,144,140 | - |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 156,848,585 | - |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **1,812,992,725** | - |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 84,644,181 | - |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,656,144,140 | - |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 72,204,404 | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **1,812,992,725** | - |

පිටු අංක ..01.. සිට ..35.. දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..36.. සිට ..149.. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි විධාන් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.............................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය : 2023/02/27
යමුනා පෙරේරා
ලේකම්

.............................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 27/02/2023
ප්‍රධාන මූල්‍ය නිලධාරී

2

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ - පී**

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන**

**මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

| | තත්‍ය | |
|---|---|---|
| | **2022 (රු.)** | **2021 (රු.)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 28,477,586 | - |
| අග්‍රිම ලැබීම් | 1,814,521,001 | - |
| අත්තිකාරම් අයකර ගැනීම | 228,246,267 | - |
| තැම්පතු ලැබීම් | 4,207,133 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල්ප්‍රවාහය (අ) | **2,075,451,987** | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,373,701,510 | - |
| සහනාධාර සහ මාරුකිරීම් | 19,454,168 | |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 227,259,790 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 11,560,292 | - |
| අත්තිකාරම් ගෙවීම් | 243,877,129 | - |
| තැන්පතුගෙවීම් | 4,302,900 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | **1,880,155,789** | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | **195,296,198** | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම්විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ) | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 195,296,198 | - |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | **195,296,198** | - |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් | **(195,296,198)** | - |

| | | |
|---|---|---|
| (ඊ)=(ඇ)-(ඉ) | | |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරක වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරක වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ) | - | |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන

අදාල නොවේ

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

අදාල නොවේ

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 28,058,830,000 | 28,061,769,000 | 14,684,118,000 | 52.33 |
| ප්‍රාග්ධන | 3,664,780,000 | 4,576,917,000 | 3,961,697,000 | 86.56 |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | දුම්රිය දෙපාර්තමේන්තුව | වොරන්ට් බලපත්‍ර 414-1-2-0-1003 | 466 | 466 | 466 | 100 |
| 02 | රජයේ මුද්‍රණාලය | මුද්‍රණ කටයුතු | 74 | 74 | 74 | 100 |
| 03 | ජාතික සමාජ සංවර්ධන ආයතනය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම්- පුද්ගල පඩි නඩි -414-1-2-1-1503 | 106,000 | 106,000 | 91,510 | 86.33 |
| 04 | සමාජ ආරක්ෂණ මණ්ඩලය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් පුද්ගල පඩි නඩි-414-1-2-2-1503 | 110,400 | 113,400 | 113,400 | 100 |
| 05 | ජාතික සමාජ සංවර්ධන ආයතනය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම්-අනෙ. පුනරාවර්තන -414-1-2-1-1509 | 20,000 | 20,000 | 17,290 | 86.45 |
| 06 | සමාජ ආරක්ෂණ මණ්ඩලය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් -අනෙ. පුනරාවර්තන 414-1-2-2-1509 | 25,000 | 25,000 | 25,000 | 100 |
| 07 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | උපදේශන නිලධාරීන් සඳහා වැටුප් ගෙවීම 414-2-7-0-1001 | 97,178 | 97,178 | 94,151 | 96.88 |
| 08 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | උපදේශන නිලධාරීන් සඳහා ජීවන වියදම් දීමනාව 414-2-7-0-1003 | 40,318 | 40,318 | 39,421 | 97.77 |
| 09 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | උපදේශන නිලධාරීන් සඳහා ගමන් වියදම් 414-2-7-0-1101 | 4,318 | 4,318 | 3,679 | 85.20 |
| **10** | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | උපදේශන නිලධාරීන් සඳහා ලිපි ද්‍රව්‍ය දීමනා 414-2-7-0-1101 | 470 | 470 | 441 | 93.82 |
| 11 | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා | තැපල් හා සංනිවේදන 414-2-7-0-1402 | 52 | 52 | 52 | 100 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 12 | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා | විදුලිය සඳහා 414-2-7-0-1403 | 10 | 10 | 10 | 100 |
| 13 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | ආබාධිත පුද්ගලයන් සඳහා රු.5000/- දීමනාව 414-2-7-1-1501 | 3,658,418 | 3,658,418 | 2,153,426 | 58.86 |
| 14 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | වකුගඩු රෝගීන් සඳහා මූල්‍යාධාර ලබාදීම 414-2-7-4-1501 | 2,010,438 | 2,010,438 | 1,153,633 | 57.38 |
| 15 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | උපදේශන නිලධාරීන් සඳහා දේපල ණය පොළී සඳහා රජයේ දායකත්වය 414-2-7-0-1506 | 1,574 | 1,574 | 1,326 | 84.24 |
| 16 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | උපදේශන වැඩසටහන් 414-2-7-8-2509 | 2,647 | 2,647 | 2,550 | 96.33 |
| 17 | කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා | අඩු අදායම් ලාභී ආබාධිත පුද්ගලයන් ආධාර 414-2-7-1-2509 | 240 | 240 | 240 | 100 |
| 18 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | සෞභාග්‍ය වැඩසටහන 414-2-3-3-2509 | 1,430,292 | 1,430,292 | 1,270,803 | 88.84 |
| 19 | ධීවර අමාත්‍යාංශය | සමෘද්ධි පවුල් ලකෂ 2 ක් සවිබල ගැන්වීමේ වැඩසටහන 414-2-3-4-2509 | 71,575 | 71,575 | 71,575 | 100 |
| 20 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | සමෘද්ධි පවුල් ලකෂ 2 ක් සවිබල ගැන්වීමේ වැඩසටහන 414-2-3-4-2509 | 7,112,789 | 7,112,789 | 7,112,789 | 100 |
| 21 | දුම්රිය දෙ., මහා භාණ්ඩාගාරය හා තේ හා රබර් අප. ප්‍ර. රා. අමාත්‍යාංශය | නිදහස් දුම්රිය ප්‍රවේශපත්‍ර | 35,560,000 | 35,560,000 | 1,355,630 | 100 |
| 22 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල දිවයින පුරා | ක්ෂේත්‍ර කිලධාරින්ගේ ගමන් වියදම් | 1,500,000 | 2,420,000 | 1,150,541 | 161 |
| 23 | මහා භාණ්ඩාගාරය | ජාතික ළමා රක්ෂක අධිකාරිය(පඩිනඩි) | 252,000,000 | 252,000,000 | 246,880,000 | 100 |
| 24 | මහා භාණ්ඩාගාරය | ජාතික ළමා රක්ෂක අධිකාරිය (වෙනත් මෙහෙයුම් වියදම්) | 30,000,000 | 30,000,000 | 27,500,000 | 100 |
| 25 | මහා භාණ්ඩාගාරය | ජාතික ළමා රක්ෂක අධිකාරිය ප්‍රාග්ධන වියදම් | 40,000,000 | 40,000,000 | 32,420,000 | 100 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 26 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල දිවයින පුරා | ක්ෂේත්‍ර කිලධාරින්ගේ ගමන් වියදම් | 12,000,000 | 12,000,000 | 11,578,829 | 100 |
| 27 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල දිවයින පුරා | ක්ෂේත්‍ර නිලධාරින්ගේ ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,800,000 | 1,922,000 | 178,383 | 107 |
| 28 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කළුතර | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු | 200,000 | 200,000 | 13,000 | 100 |
| 29 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කිලිනොච්චිය | වෙනත් කාර්යාලයීය වියදම් | 270,000 | 270,000 | 89,253 | 100 |
| 30 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල දිවයින පුරා | කාන්තා සංවර්ධන සංවරධන වැඩසටහන් | 6,500,000 | 6,500,000 | 3,296,990 | 100 |
| 31 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යාපනය | ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැලැක්වීමේ වැඩසටහන | 7,000,000 | 7,000,000 | 122,595 | 100 |
| 32 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල දිවයින පුරා | දිස්ත්‍රික් ළමා කමිටු රැස්වීම් වියදම් | 15,000,000 | 15,000,000 | 10,972,281 | 100 |
| 33 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල දිවයින පුරා | දිරිය මංපෙත, ව්‍යයසායකත්ව ව්‍යාපෘති ආධාර | 30,000,000 | 30,000,000 | 22,247,808 | 100 |
| 34 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල දිවයින පුරා | ක්ෂේත්‍ර කිලධාරින්ගේ ගමන් වියදම් | 8,000,000 | 8,000,000 | 6,664,244 | 100 |
| 35 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල දිවයින පුරා | ක්ෂේත්‍ර නිලධාරින්ගේ ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 800,000 | 815,000 | 84,609 | 102 |
| 36 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මාතර | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු | 100,000 | 100,000 | 5,900 | 100 |
| 37 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල දිවයින පුරා | පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා | 500,000,000 | 471,000,000 | 445,639,417 | 94 |
| 38 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල දිවයින පුරා | ගර්භණී මව්වරුන් සඳහා පෝෂණ ආහාර මල්ල | 4,000,000,000 | 3,998,000,000 | 3,690,130,458 | 100 |
| 39 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල දිවයින පුරා | පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාර ලබා දීම | 150,000,000 | 181,000,000 | 147,745,748 | 121 |
| 40 | මහා භාණ්ඩාගාරය | 'වැලිකෙලියෙන් පිටු අතරට","අරුණ දකින රට", ප්‍රගති සමාලෝචන | 995,000,000 | 1,895,000,000 | 1,750,556,114 | 190 |
| 41 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නුවරඑළිය | 24 පැය පුරා ක්‍රියාත්මක වන නිදහස් දුරකථන සේවාව (සාර්ක් සංවර්ධන අරමුදල) | 22,000,000 | 22,000,000 | 106,468 | 100 |
| 42 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල දිවයින පුරා | නිවුන් දරු ආධාර ආදී ළමුන් සඳහා වැඩසටහන් | 12,230,000 | 12,230,000 | 3,508,873 | 100 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 43 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල | දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ ප්‍රජා සන්ධ්‍යා මධ්‍යස්ථාන ඉදිකිරීමට මුදල් | 6,000,000 | 6,000,000 | 4,883,970 | 100 |
| 44 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල දිවයින පුරා | අඩු ආදායම්ලාභී දෙමාපිය දරුවන්ට ආධාර, සිරකරුවන්ගේ දරුවන්ට වැඩසටහන් | 12,076,000 | 12,076,000 | 7,584,992 | 100 |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේතය | 31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 72,000 | 72,000 | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 768,388 | 768,388 | - | - |
| 9153 | ඉඩම් | 26,000 | 26,000 | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | නැත | නැත | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | නැත | නැත | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | 789,756 | 789,756 | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | නැත | නැත | - | - |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } VOT/B/MWCA/02/2022/08    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2023 මැයි 30 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යංශය

**ශීර්ෂය 171 - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව් ආනන්ද

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල්,රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. VOT/B/MWCA/02/2022/08

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 30 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

**ශීර්ෂය 171 - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 171 - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කල යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **38** වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **16(1)** වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ **38(1)(ඇ)** උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ

සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මං ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අත්තිකාරම් ගෙවීම්

කාන්තා හා ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යංශ ඒකාබද්ධ කිරීම හේතුවෙන් අත්තිකාරම් සීමා සංශෝධනය කර තිබුණි. අත්තිකාරම් බී ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ එම සංශෝධනයන් සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයේ 2022 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශය (ACA 5 ආකෘතිය) අනුව හා විගණනය වෙත ලබාදුන් 2022 වර්ෂයේ අත්තිකාරම් බී ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට වාර්ෂික සැසඳුම් ප්‍රකාශය අනුව වියදමෙහි උපරිම සීමාව රු.60,000,000 කින්ද අවම ලැබීම් සීමාව රු.25,000,000 කින්ද උපරිම හර ශේෂ සීමාව රු.120,000,000 කින්ද වෙනසක් නිරීක්ෂණය විය.

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යංශයේ කාන්තා හා ළමා කටයුතු අංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
| --- | --- | --- |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 880 | ඇප ලේඛනය යාවත් කාලීන කර පවත්වා නොතිබුණි. |
| හානි පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 | හානි පාඩු ලේඛනය 2017 වර්ෂයෙන් පසුව යාවත්කාලීන කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ රාජ්‍ය අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ අංක 12 හි (ඇ) ඡේදයේ මාර්ගෝපදේශය පරිදි වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම පිළියෙල කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම අක්මුදල් සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) 2022 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ අමාත්‍යාංශය විසින් මාසිකව ඉල්ලුම් කළ අග්‍රිම වටිනාකම් එකතුව රුපියල් මිලියන 880.85 ක් වූ අතර භාණ්ඩාගාරය විසින් වර්ෂය තුළ ලබාදී තිබුණු අග්‍රිම වටිනාකම එකතුව රුපියල් මිලියන 578.06 ක් විය. ඉල්ලුම් කළ අග්‍රිම ප්‍රමාණයෙන් රුපියල් මිලියන 302.79 ක් එනම් ඉල්ලුම් කළ අග්‍රිමයේ ප්‍රතිශතයක් ලෙස සියයට 34.37 ක අග්‍රිම ප්‍රමාණයක් අමාත්‍යාංශයට ලබාදී නොතිබුණි. මේ හේතුවෙන් අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් වෙන්කරන ලද ශුද්ධ ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. එය අමාත්‍යාංශයේ කාර්යය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022 වර්ෂයේ සුභසාධන ව්‍යාපෘති දෙකක් සඳහා වෙන් කරගත් වාර්ෂික ප්‍රතිපාදනයෙන් රු.1,293,593,387 ක ඉතිරිවීමක් සිදුව තිබූ අතර 2022 වර්ෂයේ මාස 4 ක වියදම් ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රතිපූර්ණය කිරීම එයට හේතු වී තිබුණි.එමෙන්ම පූර්ව ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා ලෝක බැංකුව යටතේ ලබාදුන් රු.144,448,886 ක ප්‍රතිපාදන ද ඉතිරිවී තිබූ අතර කොන්ත්‍රාත් 18 ක වැඩ නතරවී තිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් පුනරාවර්තන වැය විෂයයන් 7 කට අදාලව අවසන් කාර්තුවේදී මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් යටතේ සලසා ගෙන තිබූණු එකතුව රු.57,890,000 ක් වූ ප්‍රතිපාදනවලින් රු.41,657,227 ක් උපයෝජනය නොකිරීම හේතුවෙන් සියයට

20 සිට සියයට 100 දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. අමාත්‍යාංශය විසින් නිසි කළමනාකරණයකින් යුක්තව අවසන් කාර්තුව තුල වැය විෂයයන් යටතේ වරින්වර මු.රෙ 66 මාරු කිරීම් මගින් අධි ප්‍රතිපාදන සලසා ගෙන තිබීම ඉතිරියට හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල අමාත්‍යාංශය විසින් අංක S0219, SO226 සහ SO148 දරන පරිපූරක ඇස්තමේන්තු මගින් එකතුව රු.912,076,000 ක අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ඉන් රු.145,835,161 ක් වූ ප්‍රතිපාදන අදාල කාර්යය සඳහා යොදා ගැනිමකින් තොරව ඉතිරි වී තිබුණි.

(ඇ) විදේශ ප්‍රදාන ලෙස යුනිසෙෆ් සංවිධානයෙන් පරිපූරක ප්‍රතිපාදන යටතේ 2022 දෙසැම්බර් 02 දින R-22 අක්මුදල් ලැබීම්පත්‍ර අංකය අනුව රු.12,076,000 ක මුදලක් භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණි. 2022 වර්ෂයේ මෙම මුදලින් රු.8,976,267 ක් අදාළ කාර්යය සඳහා වැය නොකර භාණ්ඩාගාරය වෙත හරවා යවා තිබුණි. එම ප්‍රතිපාදන ළමා සංවර්ධනය සඳහා යොදා ගැනීම වෙනුවෙන් ලබා දී ඇති ප්‍රතිපාදන වුවත් අදාළ කාර්යය සඳහා යොදවා නොතිබුණු බවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත බැදීම් පත්‍ර මගින් මෙම ප්‍රතිපාදන යවා තිබුණද ඒවා මුදලින් වියදම් දරා නොතිබුණි.

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

2022 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ 171-2-8-4-2509 වැය විෂය යටතේ රු.180,000 ක බැරකම් ශේෂයක් බැරකම් ලේඛනයේ ඇතුලත්ව නොතිබුණි.එසේම බැරකම් ලේඛනයේ වැය විෂයන් 6 ට අදාළව රු.203,208 ක බැරකම් ශේෂ 7 ක් 2022 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ. 110 | හානි පිළිබඳ ලේඛන පොත් සෑම දෙපාර්තමේන්තුවක් |

| | | |
|---|---|---|
| | | විසින්ම මුදල් රෙගුලාසිය යටතේ දක්වා ඇති ආකෘතිය අනුව යාවත්කාලීනව පවත්වාගෙන යායුතු වුවත් අනතුරු සිදුවීම් 3 ට අදාළ රු.16,676,350 ක අලාභහානි පිළිබඳ විස්තර එම ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. |
| (ii) | මු.රෙ. 104(3) හා 104(4) | අමාත්‍යාංශයට අයත් වාහනයක් වන අංක WPKT – 5393 දරන රථය 2022 මැයි 09 වන දින අරලියගහ මන්දිරය අසලදී ගිණි ගැනීමට ලක්වීම හේතුවෙන් මු.රෙ. 104 යටතේ ප්‍රාරම්භක පරීක්ෂණය සිදු කර 2022 ජූලි 11 දින ප්‍රාරම්භක වාර්ථාව ලබා දී තිබුණද හානියේ ප්‍රමාණය තක්සේරුකර නොතිබුණි. 2022 දෙසැම්බර් 27 දින පොදු 284 ආකෘතිය යටතේ මු.රෙ.104(4) අනුව පූර්ණ වාර්තාව ඉදිරිපත් කර තිබුණද ඊට නැතිවූ දේපළේ මුළු පිරිවැය හා නැති වීම සිදුවූ අවස්ථාවේ දේපලේ ආසන්නතම අගය හෝ ඇස්තමේන්තු කල වටිනාකම යන තොරතුරු එම වාර්තාවට ඇතුලත්කර නොතිබුණි. එසේම අලාභහානි සිදු වූ දිනයේ සිට මාස 3ක් ඇතුලත දී පූර්ණ වාර්තාව ඉදිරිපත් කල යුතු වුවත් අලාභය සිදු වී මාස 07 ට පසුව අවසන් වාර්ථාව නිකුත් කර තිබුණි. |
| (ආ) | 2019 ජනවාරි 12 දිනැති අංක DMA01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | වැටුප් ගෙවීම සම්බන්ධ උපදෙස් පත්‍රිකාවේ වැටුප් සකස්කිරීම් පරිගණක මෘදුකාංගයට අදාළ පලමු, දෙවන හා තෙවන මුරපද (Pass Word) නිලධාරීන් අතර බෙදා දිය යුතු බවට උපදෙස් ලබා දී තිබුණද එසේ සිදුකර නොතිබුණි. |

**2.5. තැන්පතු**

---------

අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරාදෙන ලද 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා රඳවාගත් ඇප තැන්පතු රු. 50,304,995 ක මුදල් කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

---

2015 ඔක්තෝබර් 15 දිනැති අංක 03/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ 02 ඡේදය සඳහන් TOD/BA/01 ආකෘතියේ 11 යටතේ සඳහන් කර ඇති පරිදි මු.රෙ. 880 ප්‍රකාරව අමාත්‍යාංශයේ නිලධාරීන් 13 දෙනෙකු සඳහා ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

---

3.1 කාර්යසාධනය

---

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

---

(අ) ළමා හා කාන්තා සංවර්ධනය තහවුරු කරමින් ඔවුන්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා සුදුසුම දිස්ත්‍රික්කය තමන් පදිංචි දිස්ත්‍රික්කය බවට පත් කිරීමේ අරමුණින් දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන කමිටු රැස්වීම් ත්‍රෛමාසිකව පැවැත්වීමට තීරණය කර තිබුණද 2022 වර්ෂයේ එම රැස්වීම් පැවැත්වීම අවම මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. ඒ අනුව 2022 වර්ෂයේ කමිටු වාර්තා පරීක්ෂා කිරීමේදී පළමු කාර්තුවේ දිස්ත්‍රික්ක 15 ක්ද දෙවන කාර්තුවේ හා තෙවන කාර්තුවේ දිස්ත්‍රික්ක 19 ක්ද, සිව්වන කාර්තුවේ දිස්ත්‍රික්ක 21 ක්ද වශයෙන් මෙම කමිටු පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. මෙම කමිටු පැවැත්වීම සඳහා කාර්තුවකට දිස්ත්‍රික්ක 25 වෙනුවෙන් රුපියල් 232,700 ක් බැගින් වාර්ෂිකව රුපියල් 930,800 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිදහස් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකාවේ අන්තර්ජාලය හරහා සිදුවන ළමා අසභ්‍ය ඡායාරූප හා වීඩියෝ බෙදාහරිමින් සිදුකරන ළමා හිංසන මැඩලීම සඳහා බ්‍රිතාන්‍යයේ ඉන්ටර්නෙට් වොච් ෆවුන්ඩේෂන් (Internet Watch Foundation) ආයතනයේ සහය ලබා ගැනීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2022 නොවැම්බර් 14 දින එම ආයතනය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. මේ සඳහා ගෙවිය යුතු මුදලින් ස්ටර්ලින් පවුම් 7000 ක් රාජ්‍ය නොවන සංවිධානයක් විසින් 2022 වර්ෂයේ අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි.නමුත් රු. මිලියන 3 ක් වූ එම මුදල 2023 අප්‍රේල් 28 දින දක්වා ඉන්ටර්නෙට් වොච් ෆවුන්ඩේෂන් ආයතනය වෙත ගෙවීම් කිරීම ප්‍රමාද වී තිබුණි. එබැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් අන්තර්ජාල ළමා හිංසනය මැඩ පැවැත්වීම සිදුකිරීමට බාධාවක් වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය.මෙම අරමුදල් ගෙවීම ප්‍රමාදවීම සම්බන්ධයෙන් එම රාජ්‍ය නොවන සංවිධානය ළමා ආරක්ෂක අධිකාරියෙන් විමසීම් කළ බවට තොරතුරු එම අධිකාරිය මඟින් නිකුත් කළ 2023 ජනවාරි 31 දිනැති NCPA/LE/IWF/2023/01 අංක දරන ලිපිය මඟින්ද විගණනයට තහවුරු විය.

### 3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන,පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ අංක 120-02-03-20-2509 දරන වැය විස්තරය යටතේ 2020 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි කාන්තා ව්‍යවසායකයන් වෙනුවෙන් ඩිජිටල් අලෙවිකරණ වේදිකාවක් (E- Pola) ස්ථාපිත කිරීමට කටයුතු කර තිබුණි. මේ සඳහා 2022 වර්ෂය අවසාන වන විට රු. 4,440,423 ක මුදලක් අමාත්‍යාංශය විසින් වියදම් කර තිබුණි. මෙය මාර්ග ගත අලෙවිකරණ වේදිකාවක් වන අතර රජයේ සහ අමාත්‍යාංශයේ අවශ්‍යතාවය අනුව නිර්මාණය කර ඇත. මෙය කාන්තා ව්‍යවසායකයින් නිශ්පාදනය කරනු ලබන නිශ්පාදන විශාල වේදිකාවක් මත ප්‍රදර්ශනය කර විකිණීම සඳහා අවස්ථාවන් ලබා දීම මගින් කාන්තාවන්ගේ සමාජ ආර්ථික සවිබල ගැන්වීම ශක්තිමත් කිරීම උදෙසා සකස් කරන ලද පද්ධතියකි. මෙම පද්ධතිය තුල කාන්තාවන් 143 දෙනෙකු පමණ ලියාපදිංචි කර තිබුණද අලෙවිකරණ කටයුතු 2022 වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි.

### 3.2 විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාන්තා උපකාරක දුරකථන සේවාව 1938 සඳහා 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ලැබී ඇති පැමිණිලි පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු අනුව පැමිණිලිවල සීඝ්‍ර වර්ධනයක් නිරීක්ෂණය විය.එසේම සතියේ දින 07 හිම පැය 24 පුරා ක්‍රියාත්මක කිරීම 2020 වර්ෂයේ සිට ආරම්භ වී තිබුණි. මෙම දුරකථන සේවාව ක්‍රියාත්මක වීම සම්බන්ධව මෙහෙයුම් කමිටුවක් මගින් අධීක්ෂණය හා මෙහෙයවීම සිදුකරන බව කාර්යසාධන වාර්ථාවෙහි දක්වා තිබුණද මෙහෙයුම් කමිටු අධීක්ෂණය හා මෙහෙයුම් අනු කමිටු රැස්වීම් 2020 ජූලි මස 30 දිනෙන් පසු පවත්වා නොතිබුණි.

(ආ) ලෝක බැංකු ආධාර යටතේ මෙම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.37,258,839 ක් වටිනා මුල්ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 20 ක් ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබාදී තිබුණද එම ඉදිකිරීම් අවලංගු කර තිබුණි. මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුව මගින් රු. මිලියන 995 ක ප්‍රතිපාදනයක්ද පරිපූරක ඇස්තමේන්තු මගින් රු. මිලියන 900 ක ප්‍රතිපාදනයක්ද ලබා දී තිබුණි. ගොඩනැගිලි ද්‍රව්‍ය වල මිල ගණන් ඉහළ යාම ඒ සඳහා හේතුව ලෙස දක්වා තිබුණද නියමිත කාලසීමාව තුල සැලැස්මට අනුව කටයුතු නොකිරීම ඊට හේතු වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) සාර්ක් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රැකවරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා සාර්ක් සංවර්ධන අරමුදලින් ඇ.ඩො. 60,000 ක් වෙන් කර ඇති බවත් එම ප්‍රතිපාදන 2021 ජූලි 31 දිනට පෙර වැය කළ යුතු බවත් WA/NCW/08/28/08/VII අංක දරන රාජ්‍ය ලේකම් විසින් කාන්තා කමිටුවේ සභාපති වෙත යවන ලද ලිපියෙහි දක්වා තිබුණි.මෙම ඉදිකිරීම 2022 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි. මේ සඳහා රු. මිලියන 25 ඇස්තමේන්තුවක් සකස් කර හොරණ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 09 දින අමාත්‍යාංශය වෙත එවා තිබුණි.මේ සඳහා 2022 වර්ෂයේ 171-2-08-05-2509 වැය විෂය යටතේ රු.මිලියන 15.1 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද එම ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී උපයෝජනය කර නොතිබුණි.

(ඈ) 2022 වර්ෂයේ කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ සාර්ක් සංවර්ධන ව්‍යාපෘති අරමුදලේ අයවැය ඇස්තමේන්තුව අනුව ළමා ආරක්ෂක අධිකාරිය සඳහා ලැප්ටොප් 15 ක් මිලදීගැනීමට රු.මිලියන 3 ක් වෙන් කර තිබුණි.2022 වර්ෂයේ සාර්ක් සංවර්ධන අරමුදලින් මේ සඳහා ගෙවීම් කළ යුතු වුවත් අමාත්‍යාංශයේ වෙනත් කාර්යයන් සඳහා වෙන් කර තිබූ අරමුදල් වලින් 2022 මැයි මස 05 වන දින රු.3,535,500 ක මුදලක් 403-2-4-6-2509(13) වැය විස්තරය යටතේ ගෙවීම් කර තිබුණි. එදින වන විට සාර්ක් සංවර්ධන අරමුදලේ මුදල් පොත අනුව මුදල් ශේෂය රු.775,750 ක් පමණක් විය. ඒ අනුව අමාත්‍යාංශයේ වෙනත් කාර්යයන් සඳහා පවතින අරමුදල් ලැප්ටොප් 15 ක් මිලදීගැනීම සඳහා යොදවා ඇති බවත් වාර්ෂික සැලැස්මට අනුව කටයුතු නොකරන බවත් විගණනයට නිරීක්ෂණය විය.

3.3 වත්කම් කළමනාකරණය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයට අයත් ලියාපදිංචි අංක CAR -9294 දරන රුපියල් මිලියන 35 ක් වටිනා බෙන්ස් රථය අවිධිමත් ලෙස අමාත්‍යාංශය තුල රඳවා තබා ගෙන තිබූ අතර මෙම රථය 2022 ජූලි 12 දින සිට විගණන අවස්ථාව වන 2023 මාර්තු 15 දින වන විටත් මාස 08 ක කාලයක් ධාවනයේ නොයෙදවා නිශ්කාර්යව පවතින්නට ඉඩ හැර තිබුණි.

(ආ) ග්‍රාම ශක්ති කාර්යාංශය, සෞභාග්‍යා කාර්යාංශය වශයෙන් සංශෝධනයේදී එවකට ග්‍රාම ශක්ති කාර්යාංශය සතුව පැවති අයිතම් 49 කට අදාල කාර්යාල උපකරණ ඒකක 519 ක් අතුරින් අයිතම් 21 කට අදාල භාණ්ඩ ඒකක 60 ක් සෞභාග්‍යා කාර්යාංශය වෙත පවරාගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2023 ජනවාරි 13 දිනැති නුගතලාව උපදේශන මධ්‍යස්ථානයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව එම මධ්‍යස්ථානයේ පවතින වැසිකිළිය භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින බවත්, සේවාලාභීන් සඳහා වැසිකිළියක් නොමැති බවත්, උපදේශන මධ්‍යස්ථානය හඳුනාගැනීම හා සේවාවන් පිළිබඳ දැනුවත් වීමට නාමපුවරුවක් නොමැති බවත,මධ්‍යස්ථානයේ පවතින උපකරණ අනාරක්ෂිත තත්ත්වයේ පවතින බවත් වාර්තා කර තිබුණි.

(ඈ) අමාත්‍යාංශයේ පුස්තකාලයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්ථාව අනුව පුස්තකාල පොත් 61 ක් ස්ථාන මාරු වී ගිය නිලධාරීන් විසින් ආපසු භාරදී නොමැති බව දක්වා ඇත.

3.4 පාඩු හා හානි

----------------

පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

(අ) 2014 සැප්තැම්බර් 24 දින අනතුරට පත්වූ ලියාපදිංචි අංක KA 6730 දරන වාහනය සම්බන්ධයෙන් මු.රෙ. 104(3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව අනතුර සිදුවී වර්ෂ 2 ක් කල්ගතවී ඉදිරිපත් කර තිබුණු අතර මු.රෙ.104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීම හා මු.රෙ.105,106 ප්‍රකාරව කටයුතු ක්‍රියාත්මක කිරීම සිදුකර නොතිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට මෙම අනතුර සිදුවී වර්ෂ 8 කට වැඩි කාලයක් ගත වී තිබුණද අනතුරට පත් මෙම වාහනය අළුත්වැඩියා කිරිමට කටයුතු කර නොතිබුණි. අනතුර සම්බන්ධව රක්ෂණ වන්දි ඉල්ලුම් කර තිබුණේ වසර 6 කට පසු 2020 ඔක්තෝබර් 26 දින දී වන අතර රක්ෂණ වන්දි ඉල්ලුම් කිරීම ප්‍රමාද කිරීම හේතුවෙන් රක්ෂණ වන්දි ලබා ගැනීම අවිනිශ්චිත තත්වයක පැවතුනි. තවද අලාභයට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය අමාත්‍යවරයාගේ සම්බන්ධිකරණ ලේකම්වරයාට අනුයුක්ත කරන ලද, අංක PG 1347 දරන නිල රථය 2021 අප්‍රේල් 17 දින අනුරාධපුර දහයියාගමදී අනතුරකට පත්ව තිබුණු අතර කැබ්රථයේ සැපයුම් නියෝජිත ආයතනය විසින් අළුත්වැඩියා වියදම රු.371,945 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. රක්ෂණ වන්දි ලැබී තිබුණේ රු. 263,508 ක් වූ අතර රු. 108,411 ක් වු අළුත්වැඩියා වියදමෙහි ඉතිරිය අමාත්‍යාංශය විසින් නියෝජිත ආයතනය වෙත ගෙවා තිබුණි. එසේ අමාත්‍යාංශයට දැරීමට සිදුවූ අළුත්වැඩියා වියදම අනතුරට වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. අනතුරට අදාල "මු.රෙ. 104 (3) ප්‍රකාරව" විමර්ශනය අනතුර සිදුවී මාස 6 කට පසු එනම් 2021 සැප්තැම්බර් 29 දිනදී හා මුදල් රෙගුලාසි 104(4) අනුව පූර්ණ වාර්තාව අනතුර සිදුවී

මාස දාහතකට පසු එනම් 2022 සැප්තැම්බර් 12 දින ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි.

(ඈ) 2015 ජූනි 8 දින ජල පහරකට අසුවීමෙන් අනතුරට පත් වී තිබූ KM 7727 දරන Land Cruiser Jeep රථයේ අලුත්වැඩියාව සඳහා රු.6,817,698 ක මුදලක් වැය වී ඇත.එයින් රු. 3,366,753 ක මුදලක් රක්ෂණ සමාගම විසින් ගෙවා ඇත. මු.රෙ. 104(4) වාර්තාවේ අනු අංක 8.5 යටතේ අළුත්වැඩියාව සඳහා වැයවන මුදලින් රක්ෂණ සමාගම විසින් නොගෙවනු ලබන ඉතිරි මුදල් රියදුරු මහතාගෙන් අයකර ගන්නා ලෙස දක්වා තිබුණද ඉතිරි මුදල වන රු.3,450,945 ක වටිනාකම අමාත්‍යාංශය විසින් 2021 දෙසැම්බර් 30 දින ගෙවා තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ගතයුතු ක්‍රියාමාර්ග නියමිත කාලසීමාව තුළ නොගැනීම හේතුවෙන් රජයට රු.3,450,945 ක මුදලක අලාභයක් වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) WP KT-5393 දරන මෝටර් රථය 2022 මැයි 09 දින භාවිතයට ගත නොහැකි ලෙස ගිණිතැබීමට ලක් වීමෙන් සිදු වූ හානිය තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් ප්‍රකාශයේ ඇතුලත්කර නොතිබුණි.මුදල් රෙගුලාසි 104(4) යටතේ වූ අවසන් වාර්තාව අනුව රක්ෂණ සමාගමෙන් රු.මිලියන 16.5 ක් අයකර ගත හැකි බව දක්වා තිබුණද එයද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2015 වසරේ සිදු වූ වාහන අනතුරු දෙකකට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු, 5,257,895 ක අය කර ගතයුතු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2015 මාර්තු 10 දින KC – 1017 දරන ජීප් රථය අනතුරට පත්වීම හේතුවෙන් යථා තත්ත්වයට පත් කිරීම සඳහා රු. 85,005,997 ක අළුත්වැඩියා ඇස්තමේන්තුවක් වාහන අළුත්වැඩියාවන් සිදු කරන ආයතනයකින් ලබා දී තිබූ අතර රක්ෂණ සමාගම ජීප් රථයේ අයිතිය පවරාගෙන රු.මිලියන 4.5 ක් ලබා දීමට එකඟ වී තිබුණි. 2022 මාර්තු 9 දින රක්ෂණ සමාගමේ ලිපිය අනුව රක්ෂණ සමාගම වෙත වාහනය පවරා ගැනීමට ප්‍රමාද ගාස්තු ලෙස සියයට 5 ක දඩ මුදලක් අය කරන බවත් දක්වා තිබුණි. එහෙත් එකඟ වූ මුදලින් සියයට 7 ක දඩයක් අයකර, රු. 4,193,050 ක මුදලක් පමණක් අමාත්‍යාංශයට ගෙවීම් කර තිබුණි. මෙහිදී සිදුවූ හානිය/පාඩුව මු.රෙ 105 (ඇ) අනුව තක්සේරු කර නොතිබූ අතර වාහනය යථාතත්ත්වයට පත් කිරීමට වැයවන වියදම හා රක්ෂණ වන්දි මුදල අතර රු.මිලියන 4 ක වෙනසක් පැවතුනි. එය රජයට සිදු වූ පාඩුවක් වන අතර මේ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් කමිටුව වෙත සැපයීම සඳහා තොරතුරු රැස් කර තබා ගැනීමේ දුෂ්කරතාවය සහ නිවැරදි , කාලීන දත්ත හා වාර්තා අදාල ආයතනයට සැපයීමේ අරමුණෙන් UNCRC දත්ත පද්ධතිය නිර්මාණය කර තිබුණි. දත්ත පද්ධතියක් සකස් කිරීමට සහ එහි උපදේශන ගාස්තු සඳහා ළමා හා කාන්තා කටයුතු සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය විසින් පිළිවෙලින් පෞද්ගලික ආයතනය වෙත රු.1,750,000 ක මුදලක්ද, භාහිර උපදේශකවරයෙකු සඳහා රු.600,000 ක මුදලක් ද, වශයෙන් එකතුව රු.2,350,000 ක මුදලක් ගෙවා තිබුණි. දත්ත පද්ධතියක් සංවර්ධනය කර පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණද, 2023 අප්‍රේල් 18 දින වන විටත් UNCRC දත්ත පද්ධතිය ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පවතී. දත්ත පද්ධතියක් සංවර්ධනය කිරීමට පෙර ආයතනයේ අවශ්‍යතාවය සහ ආයතනයේ ධාරිතාවය පිළිබඳ සේවා යෝජක ආයතනය සමග සන්නිවේදනය කර ආයතනයට වඩාත් ගැලපෙන ආකාරයට (user friendly) නිර්මාණය කර ගත යුතු වුවද UNCRC දත්ත පද්ධතිය සම්බන්ධව ආයතනයේ අවශ්‍යතාවය එකී ආයතනය වෙත සන්නිවේදනය වී නොමැති බවත් දත්ත පද්ධතිය භාර ගැනීමට පෙර එහි ක්‍රියාකාරීත්වය ඉල්ලුම් කල ප්‍රමිතීන්ට අනුකූලව තිබේද යන්න පරීක්ෂා කර නොමැති බවත් නිරීක්ෂණය විය.

(ආ) මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වර්ෂ 05 ක කාලයක් සඳහා 2017 සහ 2018 වර්ෂ වලදී කාර් රථ දෙකක් ලබාගෙන තිබුණි. මෙම වාහන දෙක සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විට රු. 17,961,816 ක කල්බදු ගාස්තු ගෙවා තිබුණු අතර, එකී ගාස්තුවට අදාල මාසිකව අවම වශයෙන් ධාවනය කල යුතු කි.මී.3,000 දුර ප්‍රමාණයවත් ධාවනය කර නොතිබුණි. පිරිවැය වාර්තා අනුව අමාත්‍යාංශයේ සංචිත වාහන වල ධාවනය ඉතා අවම මට්ටමක පැවතිම හා සංචිත වාහන ඵලදායීව උපයෝජනය කර නොතිබීම සහ අමාත්‍යාංශය සතු වාහන වෙනත් ආයතනවලට පවරා දී තිබියදි කල්බදු පදනම මත වාහන ලබාගෙන කල්බදු වාරික වශයෙන් 2022 දෙසැම්බර් 31 දින වන විට රු.17,961,816 ගෙවීම ඵලදායී නොවන බැවින් එම ගෙවීම් අනාර්ථික ගනුදෙනුවක් ලෙස නිරික්ෂනය කෙරේ.

**4.** මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

**2009** ජූනි **17** දිනැති අංක **09/2009(i)** දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ **2(i)** වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අමාත්‍ය කාර්ය මණ්ඩලය, අමාත්‍ය ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් ඇතුළුව සියලුම රාජ්‍ය සේවකයින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම, ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කළ යුතු වුවත්,පෞද්ගලික ලේකම්, සම්බන්ධීකරණ ලේකම්,මාධ්‍ය ලේකම්, මහජන සම්බන්ධතා නිලධාරී,කළමනාකරණ සහකාර සංවර්ධන නිලධාරි, රියදුරු, කාර්යාල කාර්ය සහායක යනාදී අමාත්‍ය කාර්යාලයේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් **11** දෙනෙකු ඇඟිලි සලකුණු යන්ත්‍රයේ හා පැමිණීමේ ලේඛනයේ පැමිණීම, පිටවීම සටහන් කර නොතිබුණි. එසේ පැමිණීමේ හා පිටවීමේ සටහන් මත සහතික කිරීමෙන් හා සත්‍ය වශයෙන් නියමිත පරිදි සේවයට වාර්තා කර ඇති බව තහවුරු කර ගැනීමකින් තොරව ඉහත චක්‍රලේඛ විධිවිධානයන්ට වලට පටහැනිව එම කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

ඩබ්ලිව් ආනන්ද

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල්,රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

# පරිච්ඡේදය 04
## කාර්ය සාධන දර්ශක

### 4.1. කාන්තා හා ළමා කටයුතු අංශය

### 4.1.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| නිවස පදනම් කරගත් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් පොත මුද්‍රණය | √ | | |
| දිස්ත්‍රික්ක 25 සඳහා දිස්ත්‍රික් කාන්තා හා ළමා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම (25*4) | | | √ |
| කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ ස්වයං රැකියා ව්‍යාපෘති ආධාර ලබාදුන් කාන්තාවන් ගණන | √ | | |
| පාසල් ළමුන්ගේ මාර්ගගත අධ්‍යාපනය පළිබඳ සිදුකරන ලද සමීක්ෂණ වාර්තාව | √ | | |
| ගර්භනී හා කිරිදෙන මව්වරුන්ට රු. 20,000/- ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන | | √ | |
| පෙර පාසල් දරුවන්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාරවේලක් ලබාදීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබාදුන් දරුවන් සංඛ්‍යාව | | | √ |
| පෙර පාසල් ගුරුවරියන් සඳහා රුපියල් 2500/- ක මාසික දීමනාවක් ලබාදීමේ "ගුරු අභිමානී" වැඩසටහන යටතේ දීමනාව ලබාදුන් පෙර පාසල් ගුරුවරු සංඛ්‍යාව | | √ | |
| මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ පෙර පාසල් දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | √ | | |
| දරුවන්ගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරීම සඳහා අධ්‍යාපන ආධාර ලබාදුන් ආර්ථික අපහසුතා සහිත දරුවන් සංඛ්‍යාව | √ | | |
| අවදානම් සහගත දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද ආරක්ෂණ සැලසුම් සංඛ්‍යාව | √ | | |
| පවත්වන ලද ළමා සමාජ හා ළමා සභා රැස්වීම් සංඛ්‍යාව | | √ | |
| ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් දැනුවත් කිරීම | √ | | |
| බන්ධනාගාරගත වූවන්ගේ පවුල් සඳහා සහන සැලසීම සහ එම පවුල් දැනුවත් කිරීම. | | | √ |
| කාන්තා, ළමා හිංසන අවම කිරීමේ අරමුණින් පවත්වන ළමා හා කාන්තා දිස්ත්‍රික් සංවර්ධන කමිටු ගණන | | √ | |
| අළුත් වැඩියා කරන ලද ළමා නිවාස ගණන | √ | | |

| | | | |
|---|---|---|---|
| ළමුන්ට එරෙහි හිංසනයන් වැලැක්වීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන | | √ | |
| කුඩා හා මධ්‍ය පරිමාණ ණය /සහණාධාර මත තිරසාර ව්‍යවසායන්හි යෙදී සිටින කාන්තාවන් සංඛ්‍යාව | | √ | |
| ශ්‍රම බලකායේ කාන්තා දායකත්වය වැඩිවූ ප්‍රතිශතය | | √ | |
| රැකියා උදෙසා විදේශගත වූ සහ විදේශගතවීමට ඉඩකඩ ඇති කාන්තාවන් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති සංඛ්‍යාව | √ | | |
| ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ලිංගිකත්වය මත පදනම් වූ හිංසනය වැළක්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම | √ | | |

## 4.2. සමාජ සවිබලගැන්වීම් අංශය

### 4.2.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| **පාලන අංශය** | | | |
| කුසලතා හා දැනුම වර්ධන සහ ආකල්ප හා දැනුම වර්ධන පුහුණු වැඩසටහන් යටතේ පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව | | √ | |
| උපදේශන අංශය | | | |
| 24 පැය ජංගම දුරකථන උපදේශන සේවාව | √ | | |
| මාර්ගගත දත්ත ගබඩාවක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම | | √ | |
| අන්තර්ජාල සේවා පහසුකම් ලබා ගැනීම සඳහා ගාස්තු | √ | | |
| උපදේශන අංශය සඳහා පරිගණක උපකරණ මිලදී ගැනීම | √ | | |
| උපදේශන සේවාව ප්‍රවර්ධනය සඳහා වන ප්‍රචාරණය | √ | | |
| ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් උපදේශන ක්‍රියාකාරම් සම්බන්ධීකරණය හා අධීක්ෂණය | √ | | |
| ප්‍රජාව ආර්ථිකමය වශයෙන් සවිබලගැන්වීමේ දී මානසික ව්‍යාකූලතාවන්ට ගොදුරුවීම වැළැක්වීම හා මානසික ව්‍යාකූලතාවන්ට ගොදුරු වූවන් සඳහා උපදේශන මැදිහත්කරණ වැඩසටහන් පැවැත්වීම | √ | | |
| සෞභාග්‍යා සති (උපදේශන සායන පැවැත්වීම) | √ | | |
| උපදේශන නිලධාරින් සඳහා කාර්යාල උපකරණ මිල දී ගැනීම | √ | | |

| | | | |
|---|---|---|---|
| උපදේශන නිලධාරීන්ගේ නිපුණතාවන් සංවර්ධනය කිරීම | √ | | |
| ජාතික උපදේශන දින සැමරුම | √ | | |
| ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය | | | |
| ආධාරක උපකරණ ලබාදුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව | √ | | |
| වෛද්‍ය ආධාර ලබා දුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව | √ | | |
| අධ්‍යාපන ආධාර ලබා දුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව | √ | | |
| ස්වයංරැකියා ආධාර ලබාදුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව | √ | | |
| නිවාස ආධාර ලබාදුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව | √ | | |
| රු.5000 මාසික ජීවනාධාර ලබා දුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව | √ | | |
| රු.5000/- ජීවනාධාර ලබා දුන් වකුගඩු රෝගීන් සංඛ්‍යාව | √ | | |
| නඩත්තු වියදම් ගෙවීම මඟින් සුබසාධනය ලැබූ වික්ටෝරියා නිවාසයේ නේවාසික පිරිස | √ | | |
| රැකියා පුහුණුව ලැබූ ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව | | | √ |
| ජාතික සමාජ සංවර්ධන ආයතනය | | | |
| සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව හදාරන ලද සිසුන් සංඛ්‍යාව | √ | | |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී පාඨමාලාව හදාරන ලද සිසුන් සංඛ්‍යාව | √ | | |
| සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ලද සිසුන් සංඛ්‍යාව | √ | | |
| ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ පුද්ගලයින් සංඛ්‍යාව | √ | | |
| වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සහභාගී වූ පුද්ගලයින් සංඛ්‍යාව | √ | | |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා හදාරන ලද සිසුන් සංඛ්‍යාව | √ | | |
| ඉදිකරන ලද නව ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ගොඩනැගිල්ල | √ | | |
| මුද්‍රණය කර ඇති සමාජ වැඩ පිළිබඳ ප්‍රකාශන සංඛ්‍යාව | √ | | |
| විවිධ සමාජ ගැටළු සම්බන්ධයෙන් සිදුකර ඇති පර්යේෂණ හා ශක්‍යතා අධ්‍යයන සංඛ්‍යාව | | √ | |
| ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය | | | |
| බඳවාගත් සාමාජික සංඛ්‍යාව | √ | | |
| ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය | | | |
| නිම කරන ලද පර්යේෂණ/ සමීක්ෂණ සංඛ්‍යාව(“වර්තමාන වෙළෙඳපොළ උද්ධමනය අඩු ආදායම්ලාභී පවුල්වල අර්ථිකයට කර ඇති බලපෑම” පිළිබඳ සමීක්ෂණය) | √ | | |
| 2022 වාර්ෂික සැලැස්ම පිළිබඳ සමාලෝචනය සහ 2023 වාර්ෂික සැලැස්ම සැකසීම) | √ | | |
| පුහුණු වැඩසටහන් සංඛ්‍යාව සහ සහභාගිවූ පුහුණුලාභීන් සංඛ්‍යාව(අඩු ආදායම්ලාභී පවුල් සවිබල ගැන්වීමේ කටයුතුවල නිරත සංවර්ධන මැදිහත්කරුවන් සඳහා වූ පුහුණු වැඩසටහන) | √ | | |

| | | | |
|---|---|---|---|
| ප්‍රකාශන සංඛ්‍යාව (ප්‍රජාශක්ති සඟරාව, වෙබ් ප්‍රකාශනය) | √ | | |
| යාවත්කාලීන කරන ලද ලිපි සංඛ්‍යාව (වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම) | √ | | |
| ප්‍රකාශන සංඛ්‍යාව (තරණය පුවත් හසුන, වෙබ් පිටුව) | √ | | |
| සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය | | | |
| ස්ථාපිත කරන ලද සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන සංඛ්‍යාව | | | √ |
| පවත්වන ලද සෞභාග්‍යා ප්‍රවර්ධන වැඩසටහන ප්‍රමාණය | | | √ |
| ගෙවා අවසන් කරන ලද 2021 අතැති බිල්පත් ප්‍රමාණය | √ | | |
| ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය | | | |
| අවුරුදු 70ට වැඩි,අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙනුවෙන් මාසික රු.2,000/ දීමනාව ගෙවීම. | √ | | |
| අවුරුදු 100 සපිරි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රු.5,000/ දීමනාව ගෙවීම. | √ | | |
| ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබලගැන්වීම් සංඛ්‍යාව. | | √ | |
| පුහුණු, පර්යේෂණ හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව. | | | √ |
| වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කළ සංඛ්‍යාව. | | √ | |
| වැඩිහිටි නිවාසවල වැඩිහිටියන් සඳහා වඩා හොඳ පහසුකම් සැපයීම හා වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීම, ලියාපදිංචිය හා නඩත්තු කළ සංඛ්‍යාව. | √ | | |
| වැඩිහිටියන් සඳහා නීති පහසුකම් සැපයීම හා නඩත්තු මණ්ඩලය පැවැත් වූ වාර ගණන. | √ | | |
| අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ ලබාදුන් සංඛ්‍යාව | √ | | |
| ආරෝග්‍යා මුල්‍යාධාර ක්‍රමය යටතේ ආධාර ලබාදුන් සංඛ්‍යාව. | √ | | |
| ස්වයං රැකියා ආධාර ලබාදුන් වැඩිහිටි ප්‍රතිලාභීන් සංඛ්‍යාව. | | √ | |
| වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකළ හා සංවර්ධනය කළ සංඛ්‍යාව. | | | √ |
| සුවපහසු මුල්‍යාධාර ක්‍රමය යටතේ ආධාර ලබාදුන් සංඛ්‍යාව. | √ | | |
| දිරිය පියස ව්‍යාපෘතිය යටතේ ඉදිකළ නිවාස සංඛ්‍යාව. | √ | | |

# පරිච්ඡේදය 05

## තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 කාන්තා හා ළමා කටයුතු අංශය

### 5.1.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 1 වන ඉලක්කය වන සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම. (SDG 01) | 1.1 ජාතික මට්ටමේ අර්ථ නිරූපණවලට අනුකූල වන පරිදි සියලුම ආකාරයේ දරිද්‍රතාවන්ගෙන් පෙළෙන සියලු වයස් කාණ්ඩවලට අයත් පිරිමින්, කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩුකිරිම (1.2) | 1.1.1 ස්වයං රැකියා ආධාර ලබාදුන් කාන්තාවන් ගණන | | | |
| | 1.2 දරිද්‍රතාව තුරන් කිරිමේ ක්‍රියාවලීන් සඳහා ආයෝජනය කිරීම වේගවත් කිරිමට, දරිද්‍රතාවෙන් පෙළෙන අය සඳහා ප්‍රමුඛත්වය ලබාදෙන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ජාතික, කලාපීය සහ අන්තර්ජාතික මට්ටමේ ප්‍රතිපත්ති රාමු නිර්මාණය කිරීම (1 b) | 1.2.1 ආදායම් උත්පාදන පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන | | | |
| | | 1.2.2. ගෘහමූලික කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබාදුන් කාන්තාවන් ගණන | | | |
| | | 1.2.3. අවධානම් සහගත දරුවන් සඳහා ආරක්ෂණ සැලසුම් (care plans ) වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ආධාර ලබා දුන් ළමුන් ගණන. | | | √ |
| | | 1.2.4 ආපදා අවස්ථාවන්හිදී කාන්තාවන්ට සිදුවන බලපෑම අවම කිරීම පිණිස ( කාන්තා කාර්ය සංවිධාන සඳහා) පවත්වනු ලැබූ දැනුවත් කිරීම් සංඛ්‍යාව | √ | | |
| | | 12.5 ගෘහ සේවය සඳහා විදේශ ගතවන කාන්තාවන්ගේ ආර්ථිකය, පවුල් සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා පවත්වන ලද විකල්ප අදායම් උත්පාදන වැඩසටහන් ව්‍යාපෘති සංඛ්‍යාව | √ | | |
| | | 12.6 විශේෂිත හේතූන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාවන් ආර්ථික හා සමාජයය වශයෙන් සවිබල ගැන්වූ ව්‍යාපෘති සංඛ්‍යාවන් | √ | | |

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 2).සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිත භාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම (SDG 02) | 2.1 අවුරුදු පහට අඩු ළමුන් සම්බන්ධයෙන් මිටිබව සහ ක්ෂය වීම පිළිබඳ අන්තර්ජාතික වශයෙන් එකඟතාවට පත්වූ ඉලක්ක 2025 වන විට ළඟාකර ගැනීම ද ඇතුළත්ව 2030 වනවිට සියලුම ආකාරයේ පවත්නා මන්දපෝෂණ තත්ත්වයන් තුරන් කිරීම සහ නව යොවුන් ගැහැණු ළමුන්ගේ, ගැබිණි මාතාවන්ගේ, කිරිදෙන මව්වරුන්ගේ සහ වයස්ගත පුද්ගලයින්ගේ පෝෂණ අවශ්‍යතාවන්ට විසඳුම් ලබාදීම. (2.2) | 2.1.1 " පෝෂණ දීමනාව" වැඩසටහන යටතේ රු.20000ක මාසික දීමනාව ලබාගත් ගර්භනී හා කිරිදෙන මව්වරු ගණන | | | |
| | | 2.1.2 "උදෑසන ආහාර වේල" වැඩසටහන යටතේ උදෑසන පෝෂණීය ආහාර වේලක් ලබාදුන් පෙර පාසල් දරුවන් ගණන | | | √ |
